

2023

කාර්ය සාධන වාර්තාව

நிதிச் செயலாற்றுகைக் கூற்று

PERFORMANCE REPORT

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களம்

DEPARTMENT OF WILDLIFE CONSERVATION

වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

வனஜீவராசிகள் மற்றும் வன வளங்கள் பாதுகாப்பு அமைச்சு

MINISTRY OF WILDLIFE AND FOREST RESOURCES CONSERVATION



වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

2023

කාර්යසාධන වාර්තාව

811/ඒ, ජයන්තිපුර පාර, බත්තරමුල්ල.

පටුන

අ/අ		
	පරිච්ඡේදය 01	
	ආයතනික පැතිකඩ /ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1-9
1.1	හැඳින්වීම	
1.2	ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු	
1.3	දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ, ඒවායේ කාර්යභාරය හා ප්‍රාදේශීය කාර්යාල හා දායකවන අන්තර්ජාතික සම්මුතීන්	
1.4	සංවිධාන සටහන	
1.5	දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්	
	පරිච්ඡේදය 02	
	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	10 -35
2.1	**මූල්‍ය ප්‍රගතිය සාරාංශය**	
2.2	ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වල මූල්‍ය ප්‍රගතිය	
2.3	ඒකාබද්ධ අරමුදල හා **වනසත්ත්ව සංරක්ෂණ අරමුදල යටතේ සිදුකරන ලද සංවර්ධන කාර්යයන්හි භෞතික ප්‍රගතිය**	
2.4	2023 වසරේදී දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ලද සුවිශේෂී සේවාවන්	
2.5	දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අපේක්ෂිත ඉලක්කයන් හා පවතින අභියෝග	
	පරිච්ඡේදය 03	
	වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	36-53
3.1	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	
3.2	මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය	
3.3	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	
3.5	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	
3.7	මු.රෙ 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	
3.9	විගණකාධිපතිගේ වාර්තාව	45-53

පරිච්ඡේදය 04

කාර්යසාධන දර්ශක 54

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

පරිච්ඡේදය 05

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්ය සාධනය 55-57

5.1 හඳුනාගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

5.2 තිරසර සංවර්ධන අභිමතාර්ථ 14,15 සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ 58-64

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

6.3 මානව සම්පත් සංවර්ධනය

පරිච්ඡේදය 07 65-74

7.1 අනුකූලතා වාර්තාව

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දේශීය ශාක හා සත්ත්ව ප්‍රජාවන් සංරක්ෂණය කිරීම ජාතික වශයෙන් ප්‍රමුඛ අවශ්‍යතාවයකි. ඒ අනුව ශ්‍රී ලංකාවේ සමුද්‍ර තීරය ඇතුළු දේශසීමාව තුළ වනජීවී සම්පත් දිගු කාලීනව ආරක්ෂා කිරීමේ හා සංරක්ෂණය කිරීමේ ප්‍රමුඛ කාර්යභාරය පැවරී ඇත්තේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටය. ඒ සඳහා වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ ශ්‍රී ලංකාව තුළ වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලයක් ස්ථාපිත කර කළමනාකරණය කිරීමේ නීතිමය වගකීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පැවරී ඇති අතර එසේ ස්ථාපිත කරන ලද රක්ෂිත භූමි (සමුද්‍රීය සහ ගොඩබිම රක්ෂිත) ප්‍රමාණයේ මුළු එකතුව වර්ග කි.මී 12500 ක් පමණ වේ. එය ආසන්න වශයෙන් ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් 18.9 % ක් පමණ වේ. මේ දක්වා ශ්‍රී ලංකාව තුළ ජාතික රක්ෂිත 39 ක්ද අභයභූමි 69 ක් ද අලි කළමනාකරණ රක්ෂිත 01 ක් ද ලෙස වනජීවී රක්ෂිත 109 ක් ප්‍රකාශයට පත්කර ඇත.

මෙම රක්ෂිත ප්‍රදේශ ජාලය විහිදී ඇති ආකාරය පහත දක්වා ඇත.

රක්ෂිත ප්‍රදේශ වර්ගය		**දැනට ප්‍රකාශයට පත්කර ඇති සංඛ්‍යාව**
ජාතික රක්ෂිත	දැඩි ස්වභාව රක්ෂිත	03
	ජාතික උද්‍යාන	26
	ස්වභාව රක්ෂිත	09
	වන පිවිසුම්	01
එකතුව		39
අභයභූමි		69
අලි කළමනාකරණ රක්ෂිත		01
මුළු එකතුව		109

වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ වනජීවී රක්ෂිතවලින් බැහැර පෙදෙස් වල වනජීවී සම්පත් ආරක්ෂා කිරීම සඳහා අදාල නීතිමය ප්‍රතිපාදන පනවා ඇති අතර, ඒ සඳහා අවශ්‍ය නීතිමය බලයද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

විවිධත්වයෙන් පොහොසත් මෙරට පෙව සම්පත් ඒවායේ ස්වභාවික වාසස්ථාන සමඟ සංරක්ෂණය කිරීමට අමතර වශයෙන් වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලය ශ්‍රී ලංකාව තුළ පවත්නා කෘෂි කර්මාන්තයට සහ විදුලි බල නිෂ්පාදනයට වැදගත් වන විශාල ප්‍රමාණයේ ජලාශ සහ ඒවායේ පෝෂක ප්‍රදේශවල ද දිගු කාලීන ආරක්ෂාව තහවුරු කරයි. සේනානායක සමුද්‍රය ඇතුළු ගල්ඔය නිම්නයේ ජලාශ, බොහෝ මහවැලි ජලාශ, මධ්‍යම සහ උතුරු මැද පළාත්වල පිහිටි මහවැලි ගඟෙන් ජලය ලබා ගන්නා ජලාශ,

උඩවලව, මව්ආර, ලුණුගම්වෙහෙර සහ වෙහෙරගල යනාදී මෙරට දකුණු ප්‍රදේශයේ පවත්නා ජලාශ, වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලය තුළ පිහිටයි. තවද, පරාක්‍රම සමුද්‍රය, කවුඩුල්ල, මින්නේරිය, ගිරිතලේ, පදවිය, කලාවැව සහ යෝධ වැව වැනි ප්‍රධාන වැව් රාශියකද ජල පෝෂක ප්‍රදේශ වනජීවී රක්ෂිත ප්‍රදේශ ලෙස සංරක්ෂණයට ලක්කර ඇත. මෙසේ වනජීවී රක්ෂිත ප්‍රදේශ තුළ පිහිටන කෘෂි කර්මාන්තය සහ ජල විදුලිය නිෂ්පාදනය සඳහා වැදගත් වන ජලාශ සංඛ්‍යාව 40 ඉක්මවයි. තවද මහවැලි, කැළණි, කළු සහ වලවේ යන ප්‍රධාන ගංගාවල්වල ඉහළ ජල පෝෂක ප්‍රදේශ ද පිහිටා ඇත්තේ ශ්‍රී පාද අඩවිය ස්වභාව රක්ෂිතය, හෝර්ටන්තැන්න ජාතික උද්‍යානය වැනි වනජීවී රක්ෂිත තුළය.
එමෙන්ම ශ්‍රී ලංකාවේ ස්වභාවික පරිසර ආශ්‍රිතව සංචාරක කර්මාන්තයේ ප්‍රධාන විභවයක් වන්නේ ද වනජීවී රක්ෂිත තුළ පවතින වනජීවී සම්පත් වන අතර වනජීවී රක්ෂිත ආශ්‍රිත සංචාරක කර්මාන්තය තුළින් 2023 වර්ෂය තුළ ලබා ඇති ආදායම රුපියල් මිලියන 5,723.34 ක් පමණ වේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම : වර්තමාන සහ අනාගත පරපුර උදෙසා වනජීවී උරුමයන් සංරක්ෂණය කිරීම.

මෙහෙවර : සහභාගීත්ව කළමනාකරණය මඟින් වනජීවී උරුමයන් සංරක්ෂණය තහවුරු කිරීම.

අරමුණු :

- ජාතික හා අන්තර් ජාතික ප්‍රතිපත්තීන් හා ගැලපෙන අයුරින් වනජීවී සම්පත් සංරක්ෂණය සඳහා උපාය මාර්ගික ජාතික සැලසුම් සහ වැඩසටහන් සම්පාදනය කිරීම.

- සුවිශේෂී විද්‍යාත්මක වැදගත්කමක් සහිත ස්ථාන සහිතව රට තුළ පවත්නා සියලුම ස්වභාවික පරිසර පද්ධතීන් නියෝජනය වන පරිදි රක්ෂිත ප්‍රදේශ ආරක්ෂා කිරීම ඒවා කාලානුරූපව සහ වනජීවී විශේෂවල ධරණීය ගහන පවත්වාගෙන යා හැකි ආකාරයට සංඛ්‍යාත්මකව සහ ප්‍රමාණාත්මකව වැඩිදියුණු කිරීම සහ ඒවා අතර සම්බන්ධතා ස්ථාපිත කිරීම.

- වඩාත් සුදුසු පර්යේෂණ දත්ත හා තොරතුරු මත පදනම්ව රක්ෂිත ප්‍රදේශ හඳුනාගැනීම, වර්ගීකරණය කිරීම හා කළමනාකරණය කිරීම සහ ඒවායේ තත්ත්වයන් යාවත්කාලීන සුපරීක්ෂාව.

- අන්තරායට ලක් වූ විශේෂ සඳහා සංරක්ෂණ සැළසුම් පිළියෙල කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.

- අදාළ රක්ෂිත ප්‍රදේශ තුළ පරිසර පද්ධතීන් සංරක්ෂණය කරන අතරම පාරිසරික සංචාරක කටයුතු සඳහා ඇති අවස්ථාවන් භාවිතා කිරීමේ පහසුකම් සැපයීම.

- රට තුළ වනජීවී සම්පත් නීතිවිරෝධී ලෙස භාවිතයන් අවම කිරීම සඳහා වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත සහ වෙනත් රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.

- ශ්‍රී ලංකාව තුළ වනජීවී සම්පත් කළමනාකරණයට අදාළ වන විද්‍යාත්මක පර්යේෂණ දිරිගැන්වීම.

- පුහුණු කිරීම්, දිරිගැන්වීම සහ අභිප්‍රේරණය මඟින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ හැකියාවන් වර්ධනය කිරීම.

- අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන් මඟින් මහජනතාව තුළ සංරක්ෂණය සඳහා දක්වන දායකත්වය ඉහළ නැංවීම.

- රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත ප්‍රජාවන් එකී රක්ෂිත ප්‍රදේශ මත යැපීම අඩුකිරීම සහ එම ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කිරීම මඟින් සංරක්ෂණය සඳහා එකී ප්‍රජාවන්ගේ දායකත්වය ඉහළ නැංවීම.

1.3 දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල හා ඒවායේ ප්‍රධාන කාර්යයන්

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර අනුව කටයුතු කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන අංශ 10 ක් හා ප්‍රාදේශීය වනජීවී කාර්යාල ස්ථාපිත කර ඇත. ප්‍රධාන කාර්යාලයේ අංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන කාර්යයන් හා වගකීම් පිළිබඳ විස්තර පහත වේ.

ක්ෂේත්‍ර ගත කාර්යාල

කාර්යාල කාණ්ඩය	දැනට ස්ථාපිත කර ඇති සංඛ්‍යාව
කලාප කාර්යාල	13
කලාප පශු වෛද්‍ය ඒකක	08
පශු වෛද්‍ය රෝහල්	01
උඩවලව ඇත් අතුරු සෙවණ	01
උඩවලව අලි රැඳවුම් මධ්‍යස්ථානය	01
වනඅලි පාලන ඒකක	04

ජාතික උද්‍යාන මූලස්ථාන	17
රන්දෙනිගල පුහුණු මධ්‍යස්ථානය	**01**
වනජීවී අඩවි ආරක්ෂක කාර්යාලය	74
වනජීවී බීට්ටු කාර්යාලය	85

1.3.1 ප්‍රධාන කාර්යාලයේ අංශ

1.3.1.1 සැළසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම.
- විශේෂ සංවර්ධන සහ සංරක්ෂණ කටයුතු සඳහා ව්‍යාපෘති යෝජනා සැකසීම.
- දෙපාර්තමේන්තුවේ මාසික, ත්‍රෛමාසික හා වාර්ෂික වාර්තා, වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීම.
- දෙපාර්තමේන්තුවේ www.dwc.gov.lk වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- දීපව්‍යාප්ත රේඩියෝ සන්නිවේදන පද්ධතිය හා අභ්‍යන්තර දුරකථන ජාල පද්ධතිය නඩත්තුව, කළමනාකරණය සහ වැඩිදියුණු කිරීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දීප ව්‍යාප්ත පරිගණක ජාලය කළමනාකරණය, නඩත්තුව හා වැඩිදියුණු කිරීම.
- ජාතික උද්‍යානවල ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම පරිගණකගත කිරීම හා GIS ඒකකය කළමනාකරණය කිරීම.

1.3.1.2 ස්වභාවික සම්පත් කළමනාකරණ අංශය

- රක්ෂිත ප්‍රදේශ සඳහා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම සහ සංශෝධනය.
- සම්පත් වට්ටෝරු පිළියෙල කිරීම සහ යාවත්කාලීන කිරීම.
- රක්ෂිත ප්‍රදේශ ජාලය විමර්ශනය කිරීම, ප්‍රකාශයට පත්කිරීම, මායිම් මිණුම් කිරීම සහ සලකුණු කිරීම.
- වනජීවී වාසස්ථාන කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය සහ පසුවිපරම් කිරීම.
- ආක්‍රමණශීලී ශාක සඳහා විශේෂ පාලන කටයුතු ක්‍රියාත්මක කිරීම.
- ගිනිපටි සහ වනජීවී වාසස්ථාන වල සංඝටක කළමනාකරණය.
- පරිසර දූෂණය පාලනය සහ වනජීවී විශේෂ ආරක්ෂා කිරීමේ සැලසුම් සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය.

- රක්ෂිත ප්‍රදේශ තුළ යෝජිත සංවර්ධන කටයුතු සඳහා හා රටේ සංවර්ධන ව්‍යාපෘති සඳහා පරිසර ශක්‍යතා අධ්‍යයනය සිදුකිරීම.

1.3.1.3 නීති ක්‍රියාත්මක කිරීම් අංශය

- වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත ක්‍රියාත්මක කිරීම හා අදාළ රාජකාරී සඳහා දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලයට අවශ්‍ය සහාය ලබාදීම හා පනත යටතේ සිදු කළ යුතු ලියාපදිංචි කිරීම් හා බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු සිදු කිරීම.
- වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ අවශ්‍ය සංශෝධන සිදුකිරීම සහ ඒ යටතේ පනවනු ලබන රෙගුලාසි පිළියෙල කිරීම.
- නීතිපති දෙපාර්තමේන්තුව හා නීතීය ක්‍රියාත්මක කිරීමට ආදාළ අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු.
- CITES සම්මුතිය යටතේ බලපත්‍ර නිකුත් කිරීම.

1.3.1.4 අලි සංරක්ෂණ අංශය

- ජාතික අලි සංරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, වනඅලි සම්බන්ධ දත්ත හා තොරතුරු එකතුව කළමනාකරණය කිරීම සහ යාවත්කාලීන කිරීම.
- වනඅලි පිවිසුම් ප්‍රදේශ හා පිවිසුම් ආරක්ෂා වන පරිදි වනඅලි සංරක්ෂණ ප්‍රදේශ ස්ථාපිත කිරීම.
- වනඅලි හානි සඳහා වන්දි ගෙවීම.
- ජනාවාස තුළට වනඅලින්ගේ පිවිසීම බාධක වන පරිදි විදුලි වැට, ජීවවැට සහ වෙනත් නවීන ක්‍රමවේද මඟින් භෞතික බාධක ස්ථාපිත කිරීම.
- වනඅලි කළමනාකරණය හා ඒ සඳහා අවශ්‍ය වන භාණ්ඩ මිලදී ගැනීම.

1.3.1.5 පර්යේෂණ හා පුහුණු අංශය

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා පුහුණු වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම හා විවිධ බාහිර පාර්ශ්වයන් සිදුකරන පර්යේෂණවලට අදාළ උපදෙස් සහ අනුමැතිය ලබාදීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විදේශීය පුහුණු හා සම්මන්ත්‍රණ වැඩසටහන් සඳහා නිලධාරීන් යොමුකිරීමට කටයුතු කිරීම.
- පාසල් සිසුන්, රාජ්‍ය නිලධාරීන් සහ ග්‍රාමීය ජනතාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ප්‍රදර්ශන වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම.
- ජාතික වනජීවී පුහුණු කේන්ද්‍රයේ කටයුතු අධීක්ෂණය කර එම කටයුතු පවත්වාගෙන යාම.
- දෙපාර්තමේන්තු ප්‍රචාරක සහ මාධ්‍ය වැඩසටහන් සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම.

1.3.1.6 සංචාරක සේවා කළමනාකරණ පාරිසරික සංචාරක හා ජනවිඳුම්කරණ අංශය

- සංචාරක සේවා සැළසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම, නව සංචාරක පැකේජ හඳුන්වාදීම

- සංචාරක කටයුතු විවිධාංගීකරණය.
- සංචාරක සේවා සහ පාරිසරික සංචාරක කටයුතු අලෙවිකරණය සහ ප්‍රවර්ධනය.
- රක්ෂිත ප්‍රදේශ තුළ සහ ඒ ආශ්‍රිතව සංචාරක සේවා තොරතුරු මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.
- රක්ෂිත ප්‍රදේශ මත අවට ප්‍රජාවගේ යැපීම අඩු කිරීම සඳහා එම ප්‍රජාවන් රක්ෂිත ප්‍රදේශ කළමනාකරණය සඳහා දායකකර ගැනීම.
- අධ්‍යාපනික සහ ව්‍යාප්ති වැඩසටහන් මඟින් මහජනතාව සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම.

1.3.1.7 වනජීවී සෞඛ්‍ය කළමනාකරණ අංශය

- වනසතුන්ගේ සෞඛ්‍ය තත්ත්වයන් සහ රෝග තත්ත්වයන් සම්බන්ධව සුපරීක්ෂණය සහ ක්‍රියාකාරී වීම.
- වනසතුන්ගේ පශු වෛද්‍ය ආරක්ෂණය සම්බන්ධව ඵලදායී සහ වේගවත් ප්‍රතිචාර දැක්වීම.
- වනසතුන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වීම.
- සුභසාධනය පිළිබඳ සුපරීක්ෂාකාරී වීම සහ ගුණාත්මක බව වර්ධනය කිරීම හා වනසත්ත්ව මිනිස් ගැටුම් කළමනාකාරීත්වයට දායකවීම.
- වනසත්ත්ව පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා ඇත්අතුරු සෙවණ කළමනාකරණය කිරීම.
- වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ නීතිමය ප්‍රතිපාදන වලට අනුකූලව අවශ්‍ය සහතික නිකුත් කිරීම, අවශ්‍ය අවස්ථාවලදී අධිකරණ ක්‍රියාවලියට සහාය වීම.

1.3.1.8 ඉංජිනේරු අංශය

- රක්ෂිත ප්‍රදේශ තුළ භෞතික පහසුකම් වැඩිදියුණු කිරීමේ සහ ඉදිකිරීම් සැළසුම් ක්‍රියාත්මක කිරීම.
- රක්ෂිත ප්‍රදේශ තුළ සහ අවට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැඟිලි සහ ඉදිකිරීම් නඩත්තුව හා මාර්ග පද්ධතිය නඩත්තුව සහ ඉදිකිරීම.

1.3.1.9 මානව සම්පත් සංවර්ධන අංශය

- මානව සම්පත් සහ සාමාන්‍ය පරිපාලන සැළසුම් පිළියෙල කිරීම.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීම, උසස් කිරීම, පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම.
- කාර්ය මණ්ඩලයට අදාල ස්ථානමාරු , විනය කටයුතු ,සේවා දීර්ඝ, විශ්‍රාම ගැන්වීම, විශ්‍රාම වැටුප් සහ වැන්දඹු සහ අනත්දරු අරමුදල් පිළිබඳ කටයුතු සිදුකිරීම.
- නිලධාරීන්ගේ කාර්ය සාධන කටයුතු , වැටුප් වර්ධක ගෙවීම, හදිසි අනතුරු වන්දි ගෙවීම.
- ප්‍රවාහන කටයුතු අධීක්ෂණය හා ක්ෂේත්‍ර ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියාව.

1.3.1.10 මුදල් අංශය

- දෙපාර්තමේන්තුවේ ආදායම් සහ වියදම් ශීර්ෂවල හා වනසත්ත්ව සංරක්ෂණ අරමුදලේ ඇස්තමේන්තු පිළියෙල කිරීම.


- මහා භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලබාගැනීම, කලාප කාර්යාලවලට ඒවා ලබාදීම, ප්‍රාදේශීය කාර්යාලවල අග්‍රිම ප්‍රතිපූර්ණය, සියළුම ලැබීම් ගෙවීම් ගිණුම්ගත කිරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට මාසිකව වාර්තා කිරීම හා මාසික ගිණුම් වාර්තා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සමඟ සැසඳීම.
- වාර්ෂිකව ආදායම්, වියදම්, වනසත්ව සංරක්ෂණ අරමුදල, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සහ පොදු තැන්පත් සඳහා ගිණුම් පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
- ප්‍රධාන කාර්යාලයේ සියළු ප්‍රසම්පාදන කටයුතු හා ගබඩාවේ කටයුතු අධීක්ෂණය හා පාලනය.
- විගණකාධිපති විසින් නිකුත් කරනු ලබන සියළුම විගණන විමසුම් හා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ විමසුම් සඳහා පිළිතුරු සැපයීම.

1.3.2 අන්තර් ජාතික සම්මුතීන්

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අන්තර්ජාතික සම්මුතීන් 03 ක දේශීය කළමනාකාරීත්ව අධිකාරිය ලෙස ක්‍රියාකරනු ලබයි. එම සම්මුතීන් පහත දක්වා ඇත.

- වඳ වී යාමේ තර්ජනයට භාජනය වී ඇති වන සතුන් හා ශාකවල ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය (CITES - Convention on International Trade in Endangered Species of Wild Fauna and Flora)
- තෙත් බිම් පිළිබඳ රම්සා ජාත්‍යන්තර සම්මුතිය - (Convention on Wetlands / Ramsar Convention)
- පර්යටනික වන සත්ත්ව විශේෂ සංරක්ෂණය සඳහා වන සම්මුතිය - (Conventon on the Conservation of Migratory Species of Wild Animals / Bonn Convention)

1.4 සංවිධාන සටහන



1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

වනජීවී සංරක්ෂණ අරමුදල (ව.සං.අ.)

වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ නීතිමය ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකාව තුළ වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා සහාය ලබාගැනීමේ අරමුණින් 1967 දී පිහිටුවන ලද මෙම අරමුදලේ අරමුණු පහත දැක්වේ.

- වනසතුන්ගේ ආරක්ෂාව සහ සංරක්ෂණය සඳහා මහජනතාවගේ දායකත්වය සහ සහයෝගය වැඩිකර ගැනීම.
- වනජීවී රක්ෂිත ප්‍රදේශ නඩත්තු කිරීම.
- වනජීවී සංරක්ෂණය සඳහා දක්වනු ලබන දායකත්වය අගය කිරීම සඳහා වනජීවී සංරක්ෂණ නිලධාරීන්ට සහ මහජනතාවට ත්‍යාග මුදල් සහ වෙනත් ප්‍රසාද දීමනා ගෙවීම.
- වනජීවී අපරාධවලට එරෙහිව තොරතුරු ලබාදෙන්නන් සඳහා ප්‍රසාද දීමනා ගෙවීම.

පරිච්ඡේදය 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 මූල්‍ය ප්‍රගති සාරාංශය

2.1.1 ඒකාබද්ධ අරමුදල

වියදම් කාණ්ඩය	2023 ඇස්තමේන්තුගත මුදල (රුපියල් මිලියන)	2023.12.31 දිනට වියදම (රුපියල් මිලියන)	මූල්‍ය ප්‍රගතිය (%)
මූලධන වියදම්	260.00	215.45	82.87
පුනරාවර්තන වියදම්	2,103.00	2,029.54	96.51
එකතුව	2,363.00	2,244.99	95.01

2.1.2 වනසත්ත්ව සංරක්ෂණ අරමුදල

වියදම් කාණ්ඩය	2023 ඇස්තමේන්තුගත මුදල (රුපියල් මිලියන)	2023.12.31 දිනට වියදම (රුපියල් මිලියන)	මූල්‍ය ප්‍රගතිය (%)
මූලධන වියදම්	574.97	574.89	99.98
පුනරාවර්තන වියදම්	2,099.72	2,098.89	99.96
එකතුව	2,674.69	2,673.78	99.96

2.2 ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වල මූල්‍ය ප්‍රගතිය -

2.2.1 ඒකාබද්ධ අරමුදල

වැය විෂය අංකය	වැඩසටහන	ප්‍රතිපාදන (රුපියල් මිලියන)	මූල්‍ය ප්‍රගතිය	
			(රුපියල් මිලියන)	%
මූලධන වත්කම් වැඩි දියුණු කිරීම සහ පුනරුත්ථාපනය කිරීම				
284-01-01-2001	ගොඩනැඟිලි හා නිර්මිතයන් අළුත්වැඩියා කිරීම	10.00	9.38	94
284-01-01-2002	යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම	2.00	1.98	99
284-01-01-2003	වාහන අළුත්වැඩියාව	10.00	9.87	99
මූලධන වත්කම් අත්පත් කරගැනීම				
284-01-01-2105	ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම (රක්ෂිත ප්‍රදේශ තුළ මායිම් සළකුණු කිරීම	6.00	3.65	61
284-01-01-2401	මානව සම්පත් සංවර්ධනය කිරීම	7.00	7.00	100
284-01-01-2506	රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම	5.00	3.49	69.8
284-01-01-08-2105	විදුලි වැටවල් ඉදිකිරීම	100.00	83.91	84
284-01-01-09-2506	රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය කිරීම	80.00	67.64	85
284-01-01-10-2506	රක්ෂිත ප්‍රදේශවල මාර්ග ජාලය වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම	20.00	8.51	43
284-01-01-15	විල්පත්තු ජාතික උද්‍යානය අවට බලපෑම් කලාපය කළමනාකරණ ව්‍යාපෘතිය (GIZ)	20.00	20.00	100
මුළු එකතුව		260	215.43	82.87

2023.12.31 දිනට විශේෂ අය වැය යෝජනා යටතේ සංවර්ධන වැඩසටහන් නොමැත.

2.2.2 වනසත්ත්ව සංරක්ෂණ අරමුදලේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගති සාරාංශය

වැය විෂය	විස්තරය	ඇස්තමේන්තුව (රුපියල් මිලියන)	වියදම (රුපියල් මිලියන)	මූල්‍ය ප්‍රගතිය (%)
	පුනරාවර්තන වියදම්			
3000	ස්වේච්ඡා මාර්ගෝපදේශක දීමනා	95.00	94.97	100
3002	ගමන් වියදම්	110.00	109.93	100
3003	ඉන්ධන	163.38	163.37	100
3005	ප්‍රසාද දීමනා (උසාවි දඩ මුදල් ලැබීම් වලින්)	24.69	24.68	99
3006	අලි පිළිස්සීම්	5.16	5.15	100
3007	මහජනයාට සතුන්ගෙන් වන හානි සඳහා වන වන්දි	246.23	246.21	100
3008	අලි වෙඩි මිළදී ගැනීම	301.46	301.45	100
3009	අලි පළවාහැරීමේ වියදම්	10.79	10.79	100
3010	සතුන් සඳහා ආහාර	135.86	135.86	100
3011	සේවා ගාස්තු	454.38	454.37	100
3012	වාහන අලුත්වැඩියා	153.00	152.99	100
3013	විදුලිය සහ ජලය	40.05	40.03	100
3014	තුවක්කු බලපත්‍ර	0.29	0.28	98
3016	ගුවන්විදුලි පණිවුඩ	4.83	04.83	100
3017	බංගලා වල රෙදි පිරිසිදු කිරීමේ වියදම්	3.00	02.46	82
3018	නීතීඥ ගාස්තු	0.47	00.47	100
3019	විවිධ වියදම්	82.23	82.22	100
3021	වෛද්‍ය සැපයීම්	25.33	25.31	100
3022	ජාතික උද්‍යානවල කාර්යාලයීය වියදම්	18.96	18.95	100
3023	නිලධාරීන්ගේ රෝහල් හා වෛද්‍ය ගාස්තු	0.15	00.14	96

3024	නිලධාරීන්ගේ ජීවිත හා ශාරීරික හානි සඳහා වන හානි	3.70	03.69	100
3030	සංචාරක නිවාස හා උද්‍යාන පවත්වාගෙන යාම	18.55	18.53	100
3034	විදේශීය පුහුණු	8.53	08.53	100
3036	දිරි දීමනා	118.91	118.91	100
3037	සම්මුති සම්මන්ත්‍රණ	6.28	06.26	100
3045	නඩත්තු සේවක කුටි සඳහා අවශ්‍ය උපකරණ	00.00	-	0
3046	නඩත්තු සේවක ආහාර දීමනා	48.43	48.42	100
3048	නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය උපකරණ	0.86	0.86	100
3051	අධ්‍යාපන හා ව්‍යාපෘති කටයුතු	2.02	2.01	100
3055	දේශීය පුහුණු	17.23	17.23	100
	එකතුව	**2,099.72**	**2,098.89**	**99.96**

2.2.3 මූලධන වියදම්

අනු අංකය	විස්තරය	ඇස්තමේන්තුව (රුපියල් මිලියන)	වියදම (රුපියල් මිලියන)	මූල්‍ය ප්‍රගතිය (%)
3015	වනජීවීන් සංරක්ෂණයට අදාළ වියදම්	17.46	17.46	100
3020	යන්ත්‍ර උපකරණ, විදුලි උපකරණ , ගොඩනැගිලි යනාදිය නඩත්තුව	70.9	70.89	100
3028	උද්‍යානවල සංචාරකයින්ගේ හා සතුන්ගේ පහසුකම් වැඩි දියුණු කිරීම	61.87	61.86	100
3029	වාහන, යන්ත්‍රෝපකරණ, බෝට්ටු මිලදී ගැනීම	22.76	22.76	100
3039	ප්‍රධාන කාර්යාලයේ අංශවල පහසුකම් වැඩිදියුණු කිරීම	0.71	0.7	100
3040	ජනවිහිදුම්කරණය	6.95	6.93	100
3041	සමුද්‍රජීවී සංරක්ෂණය	6.76	6.76	100
3042	වාසස්ථාන සුපෝෂණ කටයුතු	57.63	57.62	100

3044	විදුලි වැඩ නඩත්තු	117.13	117.12	100
3049	විදුලි වැට ඉදිකිරීම	200.75	200.75	100
3050	කාර්යාල උපකරණ	12.05	12.04	100
	එකතුව	**574.97**	**574.89**	**100**

2.3 ඒකාබද්ධ අරමුදල හා වනසත්ත්ව සංරක්ෂණ අරමුදල යටතේ සිදුකරන ලද සංවර්ධන කාර්යයන්හි භෞතික ප්‍රගතිය

වැඩසටහන	ප්‍රධාන කාර්ය දර්ශනය	ඒකකය	2023 නිමැවුම	
			ඒකාබද්ධ අරමුදල	වනසත්ත්ව සංරක්ෂණ අරමුදල
වාසස්ථාන සුපෝෂණ කටයුතු	ස්ථාපිත කරන ලද හා අළුත්වැඩියා කරන ලද දැන්වීම් පුවරු	සංඛ්‍යාව	114	13
	ජාතික උද්‍යාන මැණුම් කිරීම (යෝජිත කලාවැව ජාතික උද්‍යානය කි.මී.72, සෝමාවතිය කි.මී.11.32)	කි.මී	11.32	72
	ජල මූලාශ්‍ර ප්‍රතිසංස්කරණය තබ්බෝව - දිගලිය වැව කුමන - පලුකොටවල/අලියාවල දිවිලාන විල්ලුව (ජලගැළුම් නිමිනය) යාල 3 - පස්කෙම වැව	සංඛ්‍යාව	-	05
	ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම තබ්බෝව /බූන්දල/උඩවලව තබ්බෝව - හෝර්ටන්තැන්න	හෙක්ටයාර	46.52	21.66
	මාර්ගය දෙපස යටිකැලය ඉවත් කිරීම කුමන/වස්ගමුව/යාල -1 කුමන/විල්පත්තු/මාදුරුඔය ලාහුගල/වස්ගමුව/ කවුඩුල්ල මින්නේරිය උඩවලව	හෙක්ටයාර	446	102.9
	තෘණභූමි කළමනාකරණය කුමන/විල්පත්තු/මාදුරුඔය ලාහුගල/වස්ගමුව/මින්නේරිය	හෙක්ටයාර	258.27	30

ගොඩනැගිලි ඉදි කිරීම හා අළුත්වැඩියාව හා නඩත්තුව	අළුත්වැඩියා කරන ලද කාර්යාල හා පරිපාලන ගොඩනැගිලි	සංඛ්‍යාව	03	22
	අළුත්වැඩියා කරමින් පවතින පරිපාලන ගොඩනැගිලි	සංඛ්‍යාව	-	15
	අළුත්වැඩියා කරන ලද බීට්ටු කාර්යාල	සංඛ්‍යාව	-	02
	අළුත්වැඩියා කරන ලද සංචාරක නිවාස	සංඛ්‍යාව	-	11
	අළුත්වැඩියා කරන ලද නිල නිවාස	සංඛ්‍යාව	05	05
	ස්ථාපිත කරන ලද විදුලි සැපයුම් හා PABX ජාල පද්ධති	සංඛ්‍යාව	-	03
	විද්‍යුත් හා ජාල පද්ධති නඩත්තු කටයුතු (කොක්මොටේ සංචාරක නිවාසය, රිටිගල පුහුණු මධ්‍යස්ථානය, ගල්ගේ පිවිසුම, විල්පත්තු ජාතික උද්‍යානය, අම්පාර සහකාර අධ්‍යක්ෂ කාර්යාලය)	සංඛ්‍යාව	-	05
	CCTV පද්ධතිය නඩත්තු (ප්‍රධාන කාර්යාලය)	සංඛ්‍යාව	-	01
	සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කරන ලද කාර්යාල	සංඛ්‍යාව	01	10
	සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කරන ලද සංචාරක නිවාස	සංඛ්‍යාව	01	01
මාර්ග ජාලය අළුත්වැඩියාව	අළුත්වැඩියා කරන ලද මාර්ගවල දුර (විල්පත්තු ජාතික උද්‍යානය, වරාහේන පස්කෙම)	කි.මී	13	03
	අළුත්වැඩියා කරන ලද සපත්තු පාලම්	සංඛ්‍යාව	-	02
	ජල මූලාශ්‍ර ප්‍රතිසංස්කරණය හා නව ඉදිකිරීම. (විල්පත්තුව,තඹබෝව,	සංඛ්‍යාව	-	02

	යාල, මාදුරුඔය, ගිරිතලේ, තිඹිරියමංකඩ)			
රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම	ජල ටැංකි ඉදිකිරීම හා ජල සැපයුම් පහසුකම් ලබාදීම (පනිජ්ජාඹය , ගල්කොටු කන්ද, තුම්මුල්ල, ගිරිතලේ, හික්කඩුව)	සංඛ්‍යාව	04	02
	නල ළිං ඉදිකිරීම, (කරුවලගස්වැව)	සංඛ්‍යාව	01	-
	වැඩි දියුණු කරන ලද විදුලි සැපයුම් පද්ධති (රිටිගල, මැණික් සොරොව්ව, තිඹිරියමංකඩ, උඩවලව, ගිරිතලේ, හික්කඩුව)	සංඛ්‍යාව	-	07
යන්ත්‍රෝපකරණ වාහන, බෝට්ටු සහ ගිණි අවි මිලදී ගැනීම	ක්ෂේත්‍ර කාර්යාල සඳහා ගිනිඅවි රඳවන අල්මාරි මිලදී ගැනීම	සංඛ්‍යාව	-	15
	සිසිලන යන්ත්‍ර ලබා දීම - පරණ තොටුපල සංචාරක නිවාසය	සංඛ්‍යාව	-	01
	පරිගණක සර්වර් යන්ත්‍රය සඳහා අවශ්‍ය උපාංග ලබා දීම - ප්‍රධාන කාර්යාලය	සංඛ්‍යාව	-	01
	ක්ෂේත්‍ර කාර්යාල හා බංගලා වල නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය විදුලි උපාංග, රේඩියෝ සන්නිවේදන පද්ධති නඩත්තු උපාංග මිලදී ගැනීම	උපාංග කට්ටල සංඛ්‍යාව	-	03
සමුද්‍රජීව සංරක්ෂණය	මහජන ප්‍රදර්ශන නිදර්ශක සකස් කිරීම (Short finned pilot whale සත්ත්වයාගේ සැකිල්ල - කල්පිටිය අඩවි ආරක්ෂක කාර්යාලය)	සංඛ්‍යාව	-	01
	සමුද්‍රීය සංරක්ෂණ කටයුතු සිදු කිරීමේ දී ඇතිවන ගැටුම් කළමනාකරණය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම - දකුණ, ත්‍රිකුණාමලය, වව්නියාව කලාපය	සංඛ්‍යාව	-	07

	දෙපාර්තමේන්තු නිලධාරීන් 28 සඳහා පිහිණුම් හා ජීවිතාරක්ෂක පුහුණුව	සංඛ්‍යාව	-	01
	දොඩන්ගොඩ කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථානයේ ඉදිකර ඇති Dura House ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම හා නැවත ස්ථාපිත කිරීම	සංඛ්‍යාව	-	01
	Workshop on "Marine Protected Area Best Practices " with OCPP	සංඛ්‍යාව	-	01
	දොඩන්ගොඩ කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථානයේ පිහිටි කන්ටේනර් කාර්යාලය අලුත්වැඩියා හා නවීකරණය කිරීම	සංඛ්‍යාව	-	01
	හික්කඩුව ජාතික උද්‍යානයේ පිහිටි බෝයාවන් නැවත සකස් කර යෙදීම	සංඛ්‍යාව	-	01
	කැස්බෑ බීජඟෂණ ඒකකයක් ඉදිකිරීම දකුණු කලාපය	සංඛ්‍යාව	-	01
	තාවකාලික කැස්බෑ බීජඟෂණ ඒකකයක් ඉදිකිරීම බස්නාහිර කලාපය	සංඛ්‍යාව	-	01
	වේව් රයිඩර් යාත්‍රාව සේවා කිරීම	සංඛ්‍යාව	-	01
වඳවීමේ තර්ජනයට ලක්වී ඇති වනජීවීන් සංරක්ෂණය	X-ray යන්ත්‍රය සඳහා ආරක්ෂිත ඇඳුම් කට්ටල හා උපකරණ මිලදී ගැනීම	සංඛ්‍යාව	-	02
	ශල්‍ය උපකරණ හා මරණ පරීක්ෂණ උපකරණ තොගයෙහි පළමු තොගය මිලදී ගැනීම	සංඛ්‍යාව	-	09
	රිලවුන් ගහනය පාලනය සඳහා වන්ධ්‍යාකරණ ව්‍යාපෘති	සංඛ්‍යාව	-	02
	ඔක්සිජන් සැපයුම සහ අනුබද්ධ පද්ධතිය මිලට ගැනීම	සංඛ්‍යාව	-	02
	නඩත්තු උපකරණ මිලට ගැනීම (උපකරණ කට්ටල)	සංඛ්‍යාව	-	01
	කූඩුවල වහල සකස්කිරීම	සංඛ්‍යාව	-	02

	අවතැන් වූ සහ තුවාල ලැබූ කුඩා සතුන්ඇල්ලීම සඳහා ස්වයංක්‍රීය උගුල් කූඩු සකස් කිරීම.	සංඛ්‍යාව	-	58
	තාප කිරණ ලාම්පු 03 ක් මිලදී ගැනීම අත්තිඩිය වනජීවී රැඳවුම් මධ්‍යස්ථානය	සංඛ්‍යාව	-	03
	අති ධ්වනි ස්කෑන් යන්ත්‍රයක් මිලට ගැනීම	සංඛ්‍යාව	-	01
	නිර්වින්දන යන්ත්‍රයක් මිලදී ගැනීම	සංඛ්‍යාව	-	01
	ඖෂධ ගබඩා කිරීම සඳහා ශීතකරණයක් මිලදී ගැනීම අත්තිඩිය වනජීවී රැඳවුම් මධ්‍යස්ථානය	සංඛ්‍යාව	-	01
	වන සතුන් ප්‍රවාහනය සඳහා ලී කූඩු 05 ක් නිෂ්පාදනය කිරීම පණ්ඩුලගම වනජීවී සෞඛ්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය	සංඛ්‍යාව	-	05
	මුව/ගෝන සතුන් ප්‍රවාහනයට විශේෂිත කූඩු නිෂ්පාදනය කිරීම	සංඛ්‍යාව	-	06
	උගුල් කැමරා පද්ධතිය යාවත්කාලීන කිරීමට අවශ්‍ය අයිතම (බැටරි. ආරක්ෂිත ආවරණ, Memory card)	සංඛ්‍යාව	-	96
	නව එළිමහන් වනජීවී පුනරුත්ථාපන රැඳවුම් ඒකකයක් ගොඩනැගීම - ඇත් අතුරු සෙවණ	සංඛ්‍යාව	-	01
	නේවාසික සතුන්ගේ සත්ත්ව පෝෂණ ඒකකයට අවශ්‍ය ගෑස් සිලින්ඩරය සහ උදුන මිලට ගැනීම	සංඛ්‍යාව	-	02
කාර්යාල උපකරණ මිලදී ගැනීම	පරිගණක යන්ත්‍ර	සංඛ්‍යාව	-	10
	UPS	සංඛ්‍යාව	-	30
	ලැප්ටොප් පරිගණක	සංඛ්‍යාව	-	03
	මුද්‍රණ යන්ත්‍ර	සංඛ්‍යාව	-	10

	Hard disk	සංඛ්‍යාව	-	05
	මුදල් ගණිත යන්ත්‍ර	සංඛ්‍යාව	-	05
	Box Fan	සංඛ්‍යාව	-	03
	රූපවාහිනී යන්ත්‍ර	සංඛ්‍යාව	-	01
	ගිරිතලේ වනජීවී පුහුණු කේන්ද්‍රයේ අධ්‍යයන ගොඩනැගිල්ලට අවශ්‍ය ගෘහ භාණ්ඩ සැලැස්ම	සංඛ්‍යාව	-	01
	ප්‍රධාන කාර්යාලයේ සන්නිවේදන ඒකකයට හා රියදුරු කාමරයට අවශ්‍ය ගෘහ භාණ්ඩ හා ආපනශාලාව සඳහා උපකරණ	සංඛ්‍යාව	-	23
ජනවිහිදුම්කරණය	හෝර්ටන්තැන්න ජාතික උද්‍යානය ආශ්‍රිතව (ඔහිය, පට්ටිපොල) හා වස්ගමුව ජාතික උද්‍යානය ආශ්‍රිතව ජනවිහිදුම්කරණ වැඩසටහන්	සංඛ්‍යාව	-	03
	ශ්‍රී පාද අඩවිය හා යාල ජාතික උද්‍යානයේ කලාප අංක (02) හි ශ්‍රමදාන වැඩසටහන්	සංඛ්‍යාව	-	08
	පුත්තලම වනජීවී කලාපයේ අවශ්‍යතා ඇති පාසැල් සිසුන් සඳහා පාසැල් උපකරණ ලබා දීම	සංඛ්‍යාව	-	50
	ජපන් ජබර ආශ්‍රිත අත්කම් නිර්මාණ වැඩමුළු	සංඛ්‍යාව	-	03
	තික්කෝඩේ හා පිල්ලුමලේ සඳහා සූර්ය ජනන බල්බ විදුලි ලබා දීම	සංඛ්‍යාව	-	30

2.3.1 විදුලි වැට ඉදිකිරීම,

2023.12.31 දිනට ප්‍රගතිය

වනජීවී කළාපය	දිස්ත්‍රික්කය	විදුලි වැටේ නම	විදුලි වැටේ දිග (කි.මී)	ඉදිකර අවසන් විදුලි වැටේ දිග (කි.මී)	මේ දක්වා ගෙවීම් කර ඇති ප්‍රමාණය (රුපියල් මිලියන)
නැගෙනහිර	මඩකලපුව	තොනිතමඩු	3	3	0.72
		උත්තුච්චේනි - අක්කරාන	5	5	1.29
		පෙරියාවලි - ඊච්චඩි	2	2	0.60
		පෙරියාවලි - 6 කණුව	1	1	0.35
		පෙරියාවලි -මඩුපිටිතෝට්ටන්	1	1	0.33
		කෝරාවලි - වට්ටුවාන්	1	1	0.33
		උන්නච්චි - මධුරාවච්චි	1	1	0.31
		පූනානි - බටහිර සලබච්චේනි	2	2	0.63
		පූනානි - නැ.සිංහපුර	5	5	1.28
	අම්පාර	කළුගල්ඔය	18.4	18.4	6.50
		කිවුලේවත්ත	5	5	1.44
මධ්‍යම	මහනුවර	වික්ටෝරියා - වැගල	11	11	2.43
		කදන්හේන -නවදිල්ලිවැඩියාව	11	11	2.65
	බදුල්ල	අරළුපිටිය - දෙහිගම	13.5	10.4	1.30
ත්‍රිකුණාමලය	ත්‍රිකුණාමලය	මැදවච්චිය - බක්මීගහවැව	16	13.8	1.36
		නා උල්පත	2.7	2.5	0.26
		මයිලවැව	3.5	4.1	0.43
		රන්ගිරි උල්පත	1.8	1.8	0.20
		තල්ගස්වැව	2.5	2.5	0.30
		මොරගම	2	2	0.22
		ඔට්ටාචිකුලම	2	1.6	0.22
		ඇතාබැදිවැව	8.1	8.1	1.64

		කිතුල්උතුව ගම්මානය වටා	6.5	4.6	0.47
අනුරාධපුරය	අනුරාධපුරය	කිරල්පැටියාව - ඔයාමඩුව	15	15	3.18
		කිවුලේකඩ - වන්නම්කුලම්	104	6	2.02
		නල්ලමුදාව - සංඝට්ටවැව	16	12	5.46
		වේලගන්උල්පත - කිවුලේකඩ	61	20	9.36
වව්නියාව	වව්නියාව	නීලියාමොටේ	6.5	6.5	1.45
		සේම්මඩුව	9.2	9.148	0.60
අනුරාධපුරය	අනුරාධපුරය	අරුණගම - දංගොල්ල	23	9	2.37
		ග්‍රෙවල්කන්ද	7.5	5.351	1.35
		ගල්කුලම - බලයාවැව	14.5	9.6	2.67
වව්නියාව	වව්නියාව	නීලියාමොටේ	6.5	6.5	1.45
		සේම්මඩුව	9.2	9.148	0.60
	අනුරාධපුරය	අරුණගම - දංගොල්ල	23	9	2.37
		ග්‍රෙවල්කන්ද	7.5	5.351	1.35
		ගල්කුලම - බලයාවැව	14.5	9.6	2.67
දකුණ	**රත්නපුර**	හඳගිරිය - හැඹිලියපාන කපොල්ල දක්වා	5	4.1	1.22
	හම්බන්තොට	කොහොලංකල සිට සීනුග්ගල දක්වා නව එල්ලෙන විදුලි වැට	6	3	0.85
ඌව	**මොණරාගල**	5 කණුව සිට 7 කණුව දක්වා පළමු විදුලි වැට	5	5	0.70
		මුල්ලේගම - දුම්පඳුරාව	18	11.4	1.46
කුරුණෑගල	**කුරුණෑගල**	මී ඔය-පයිරික්කුලම	16	5.5	0.55
			එකතුව	**239.399**	**58.64**

2.3.2 වන අලි මිනිස් ගැටුම අවම කිරීම

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මේ වන විට විදුලි වැට කි.මී 5,390 ක් නඩත්තු කරන අතර එහි නඩත්තු කටයුතු සඳහා අනුයුක්ත කර ඇති සිවිල් ආරක්ෂකයන් 3,270 ක් හා වනඅලි පලවාහැරීම සඳහා සිවිල් ආරක්ෂක නිලධාරීන් 672 ක් අනුයුක්ත කර ඇත.

කාරණය	ප්‍රධාන කාර්ය දර්ශනය	ඒකකය	2023 නිමැවුම	
			ඒකාබද්ධ අරමුදල	වනසත්ත්ව සංරක්ෂණ අරමුදල
වනඅලි මිනිස් ගැටුම අවම කිරීම	විදුලි වැට ඉදි කිරීම	කි.මී	-	239.4
	විදුලි වැට උපකරණ මිලදී ගැනීම	ප්‍රතිශතය	100	-
	විදුලි වැට ආරක්ෂික කුටි ඉදි කිරීම	සංඛ්‍යාව		9
	මිලදී ගන්නා ලද අලි වෙඩි ප්‍රමාණය	සංඛ්‍යාව		1,483,684

2023 වසරේ වනඅලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා අලි වෙඩි මිල දී ගෙන වනඅලි තර්ජන සහිත ප්‍රදේශවලට බෙදා හැර ඇත.

අලිවෙඩි වර්ගය	ප්‍රමාණය	වියදම (රුපියල් මිලියන)
ගිගුම් (ලොකු)	342,500	71.92
ගිගුම් (පොඩි)	749,434	142.39
සංඥා දහර	391,750	103.81
එකතුව	**1,483,684**	**318.13**

2023 වර්ෂයේ අලිවෙඩි බෙදා හැරීම්				
වනජීවී කලාපය	සංඛ්‍යාව			
	ගිගුම්වෙඩි (ලොකු)	ගිගුම්වෙඩි (කුඩා)	සංඥා වෙඩි	එකතුව
පොළොන්නරුව	34,460	97,905	50,495	182,860
අනුරාධපුරය	54,640	81,965	52,585	189,190
වයඹ	39,240	86,475	45,284	170,999

නැඟෙනහිර	43,235	100,428	56,925	200,588
දකුණ	38,620	74,956	40,170	153,746
මධ්‍යම	33,600	55,415	32,011	121,026
ඌව	29,340	67,495	26,010	122,845
පුත්තලම	20,975	71,335	30,540	122,850
වව්නියාව	13,945	22,020	15,750	51,715
ත්‍රිකුණාමලය	23,965	73,485	33,300	130,750
කිලිනොච්චිය	10,480	17,955	8,680	37,115
එකතුව	**342,500**	**749,434**	**391,750**	**1,483,684**

2.3.3 වනඅලි හානි සඳහා වන්දි ගෙවීම

දිවයින පුරා වනඅලි පහරදීම් හේතුවෙන් පීඩාවන්ට පත් වූ ජනතාව සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා වනඅලි හානි සඳහා වන්දි ගෙවීම සිදු කරන අතර 2023.12.31 වන විට ගෙවන ලද වන්දි ප්‍රමාණයන් පහත පරිදි වේ.

දිස්ත්‍රික් වන්දි කමිටුවල මූල්‍ය ප්‍රගතිය (2023.12.31 දිනට)							
දිස්ත්‍රික්කය	**මරණ**		**ශාරීරික හානි**		**දේපළ හානි**		**වන්දි සඳහා ගෙවා ඇති මුළු මුදල (රුපියල් මිලියන)**
	වන්දි ගෙවන ලද සිද්ධි සංඛ්‍යාව	**ගෙවන ලද මුදල (රුපියල් මිලියන)**	**වන්දි ගෙවන ලද සිද්ධි සංඛ්‍යාව**	**ගෙවන ලද මුදල (රුපියල් මිලියන)**	**වන්දි ගෙවන ලද සිද්ධි සංඛ්‍යාව**	**ගෙවන ලද මුදල (රුපියල් මිලියන)**	
අනුරාධපුරය	43	36.10	60	6.65	716	35.40	78.15
පොළොන්නරුව	29	17.70	19	1.88	730	40.48	60.07
මාතලේ	9	2.79	12	0.77	43	3.53	7.08
කුරුණෑගල	15	13.10	28	4.13	285	11.27	28.50
මහනුවර	0	0.00	3	0.25	100	4.47	4.71
ත්‍රිකුණාමලය	11	11.30	11	1.68	176	10.20	23.19
මඩකලපුව	15	21.50	44	4.35	230	14.50	40.35
අම්පාර	22	23.30	25	1.65	612	35.93	60.84

හම්බන්තොට	13	9.10	13	1.01	86	3.25	13.36
මොනරාගල	10	5.00	6	0.39	84	5.13	10.49
පුත්තලම	7	6.00	10	0.21	79	4.62	10.82
කිළිනොච්චිය	0	0.00	0	0	0	-	0.00
මුලතිවු	0	0	0	0.00	4	0.24	0.24
වවුනියාව	0	0.00	1	0.06	9	1.00	1.06
මාතර	2	2.00	0	0.00	0	-	2.00
නුවරඑළිය	0	0.00	0	0	0	-	0.00
රත්නපුරය	1	1.00	0	0.00	3	0.05	1.05
මන්නාරම	1	1.00	3	0.16	5	0.19	1.36
කළුතර	1	1.00	0	0.00	0	-	1.00
බදුල්ල	6	3.60	4	0.15	267	16.99	20.74
එකතුව	**185**	**154.49**	**239**	**23.34**	**3429**	**187.25**	**365.01**

සැ.යු- මඩකළපුව, අම්පාර, ත්‍රිකුණාමලය සහ හම්බන්තොට දිස්ත්‍රික් වන්දි කමිටු විසින් පෙර වර්ෂයට අදාළව අනුමත කර ඇති වන්දි අයදුම්පත් සඳහා මෙම වර්ෂයේ ගෙවීම් සිදු කර ඇත. එමෙන්ම මාතර දිස්ත්‍රික් වන්දි කමිටුව විසින් කිඹුල් ප්‍රහාර හේතුවෙන් මිය ගිය දෙදෙනෙකු සඳහා වන්දි ගෙවා ඇත.

2.3.4 වඳ වී යාමේ තර්ජනයට භාජනය වී ඇති වන සතුන් හා ශාකවල ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය යටතේ සහ සත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීම

වඳ වී යාමේ තර්ජනයට භාජනය වී ඇති වන සතුන් හා ශාකවල ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය (CITES -The Convention on International Trade in Endangered Species of Wild Fauna and Flora) යටතේ බලපත්‍ර 1322 ද සත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ පනත යටතේ (Fauna and Flora Protection Ordinance) බලපත්‍ර 143 ද නිකුත් කර ඇත. එමඟින් ලබා ගෙන ඇති මුළු ආදායම රුපියල් මිලියන 2.30 කි.

2.3.5 නීතිය ක්‍රියාත්මක හා කිරීම ක්ෂේත්‍ර නිලධාරීන්ට ප්‍රසාද දීමනා ගෙවීම

වනජීවී අපරාධ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් 2023 වර්ෂයේදී සිදුකරන ලද වැටලීම් වලින් පසු පවරන ලද නඩු සංඛ්‍යාව 2053 කි. වනසත්ව හා වෘක්ෂ ලතා ආරක්ෂක ආඥා පනත යටතේ නීතිය ක්‍රියාත්මක කර දඩ මුදල් ලෙස වනසත්ව සංරක්ෂණ අරමුදලට බැර කරන රුපියල් මිලියන 91.6 ක් වූ ආදායමෙන් රුපියල් මිලියන 25.2 ක් ප්‍රසාද දීමනා ලෙස වැටලීම් වලට දායක වූ නිලධාරීන්ට ගෙවා ඇත.

2.3.6 2023.12.31 දිනට සංචාරක පැමිණීම පිළිබඳ තොරතුරු

ජාතික උද්‍යානය/ස්ථානය	සංචාරක පැමිණීම		
	දේශීය	විදේශීය	එකතුව
යාල	251,865	214,572	466,437
හෝටන්තැන්න	214,756	30,950	245,706
උඩවලව	98,561	89,827	188,388
වස්ගමුව	9,014	1,347	10,361
මින්නේරිය	40,894	21,170	62,064
බුන්දල	5,587	4,131	9,718
හොරගොල්ල	11,011	19	11,030
කවුඩුල්ල	45,564	49,059	94,623
ගල්ඔය	9,538	4,281	13,819
කුමන	21,263	7,267	28,530
අංගම්මැඩිල්ල	1,031	2	1,033
ගැල්වේස්ලැන්ඩ්	14,850	341	15,191
විල්පත්තු	49,113	24,970	74,083
මාදුරුඔය	1,624	315	1,939
ලාහුගල	437	40	477
පරෙවි දූපත්	53,992	9,384	63,376
හික්කඩුව	31,062	1,385	32,447
උඩවලව ඇත් අතුරු සෙවණ	112,080	61,596	173,676
කලාවැව	766	121	887
මිරිස්ස	16,059	60,900	76,959
වැලිපර අභයභූමිය	8,135	1,922	10,057
ගිරිතලේ	8,610	104	8,714
එකතුව	**1,005,817**	**583,703**	**1,589,520**

2.3.7 2023.12.31 දිනට සංචාරක ආදායම් පිළිබඳ තොරතුරු

ජාතික උද්‍යානය/ස්ථානය	ආදායම (රුපියල් මිලියන)
යාල	2,503.53
හෝටන් තැන්න	403.24
උඩවලව	997.21
වස්ගමුව	14.57
මින්නේරිය	228.82
බුන්දල	25.87
හොරගොල්ල	00.53
කවුඩුල්ල	519.43
ගල්ඔය	27.69
කුමන	51.10
අංගම්මැඩිල්ල	00.64
ගැල්වේස්ලැන්ඩ්	02.43
විල්පත්තු	302.28
මාදුරුඔය	02.22
ලාහුගල	01.31
පරෙවි දූපත්	132.79
හික්කඩුව	09.25
උඩවලව ඇත් අතුරු සෙවන	120.71
කලාවැව	00.55
මිරිස්ස	372.10
වැලිපර අභයභූමිය	05.96
ගිරිතලේ	00.47
එකතුව	**5,723.34**

2.4 2023 වසරේ දී දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලද සුවිශේෂී සේවාවන්

- **තෙත් බිම් දිනය සඳහා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

මේ තෙත්බිම් ප්‍රතිස්ථාපනයට කාලයයි (“It’s time for wetland restoration”) යන්න මෙවර තෙත් බිම් දිනයේ තේමාවයි. මේ යටතේ ඡායාරූප තරඟයක් හා තෙත්බිමට විනාඩියක් යන තේමාව යටතේ වීඩියෝ තරඟයක් පවත්වන ලදී. මෙම වීඩියෝ තරඟය පාසැල්, විශ්ව විද්‍යාල සහ විවෘත ලෙස කොටස් තුනකින් පවත්වන ලදි. සති දහයක් පුරා විජය පුවත්පත සමඟ ප්‍රහේලිකා තරඟයක්ද පවත්වා ඇත. මෙලෙස පවත්වන ලද තරඟාවලි ජයග්‍රාහකයන්ට ත්‍යාග හා සහතිකපත්‍ර ප්‍රදානය හා සහතික පත්‍ර ප්‍රදානය සමඟ තෙත්බිම් සම්බන්ධ දැනුවත් කිරීම්

ඇතුළත් ජාතික උත්සවය පෙබරවාරි මස දෙවැනි දින පරිසර අමාත්‍යාංශයේ ශ්‍රවනාගාරයේ දී පවත්වන ලදී.

- **ලෝක වනජීවී දිනය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

2023 ලෝක වනජීවී දිනය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් හා වව්නියා විශ්ව විද්‍යාලයේ සහයෝගයෙන් මන්නාරම, වාන්කාලෙයි අභය භූමියේ දී පැවැත්විය. වනජීවී දිනයට පූර්වගාමීව පාසැල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් විශ්ව විද්‍යාල සිසුන්ගේ සහයෝගය ඇතිව සිදුකළ අතර වනජීවී දින සැමරුමේ දී ඒ අතරින් දක්ෂතා දැක්වූ පාසැල් සිසුන් ගේ සහයෝගය ඇතිව සිදුකල අතර වනජීවී දින සැමරුමේ දී ඒ අතරින් දක්ෂතා දැක්වූ පාසැල් සිසුන් ඇගයීම සිදු විය. "වනජීවී සංරක්ෂණය සඳහා හවුල්කාරිත්වය" යන තේමාව යටතේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව තරුණ පිරිස වෙනුවෙන් ආධුනික ඡායාරූප තරගයක් පවත්වන ලදී.

- **වන අලි මිනිස් ගැටුම වළක්වා ගැනීම සඳහා ග්‍රාමීය ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්**

වනඅලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් හා ගම්වාසින් එක්ව වනඅලි ගැටුම් බහුලව පවතින ග්‍රාම නිලධාරී මට්ටමින් දැනුවත් කිරීම, විදුලි වැට ඉදිකිරීම, විදුලි වැට නඩත්තුව ගම්මාන වල වනඅලි රැඳී සිටින ස්ථාන හඳුනාගෙන එම ස්ථාන එළිපෙහෙලි කිරීම හා අඳුරු ස්ථානවල බල්බ සවිකිරීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදුකරන ලදී.

- **දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත්කරන ලද ශ්‍රී ලංකාවේ වනඅලින්ගේ DNA විශ්ලේෂණය පිළිබඳ දෙවැනි පර්යේෂණ පත්‍රිකාව**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා පේරාදෙණිය විශ්ව විද්‍යාලය එක්ව සිදුකළ වන අලින්ගේ DNA විශ්ලේෂණය අන්තර්ජාතික පර්යේෂණ සඟරාවක් වන PLOS ONE සඟරාවේ 2023.06.13 දින කළාපයේ ඇගයීමට ලක්ව ඇත. එම පර්යේෂණය මඟින් ප්‍රථම වතාවට ශ්‍රී ලංකාවේ අලින්ගේ (*Elephas maximus maximus*) මයිටොකොන්ඩ්‍රියා ජීනෝමය පිළියෙල කර ඇති අතර ශ්‍රී ලංකාවේ වෙසෙන මෙම උප විශේෂ මෙයට අවුරුදු මිලියන 0.2 කට පමණ ඉහතදී මියන්මාරයේ වෙසෙන අලින්ගෙන් වෙන් වී ඇති බවට තහවුරු කර ඇත. ඊට අමතරව ශ්‍රී ලංකාවේ අලි ගහනය ප්‍රධාන භූගෝලීය කලාපයන් තුනක් යටතේ බෙදී යන ආකාරය පැහැදිලි කර ඇත.

- **කළු කොටියාගේ සමෙහි කළු වර්ණය ඇති ජානමය හේතුව ඇතුළත් පර්යේෂණ පත්‍රිකාව ප්‍රකාශයට පත්කිරීම - ශ්‍රී ලංකා කළු කොටියාගේ (*Panthera pardus kotiya*) ජෛව භූගෝල විද්‍යාව සහ පරිණාමය පිළිබඳ පර්යේෂණ පත්‍රිකාව**

  ශ්‍රී ලංකා කොටියා (*Panthera pardus kotiya*) යනු වඳවීමේ තර්ජනයට ලක්ව ඇති උප විශේෂයකි. මෙම විශේෂය ශ්‍රී ලංකාවේ දී හුදකලා සහ ඛණ්ඩනය වූ ගහනයකින් සමන්විත වේ. ඔවුන් අතර, මෙලනිස්ටික් නොහොත් කළු කොටින් අවස්ථා කිහිපයක දී වාර්ථා වී ඇත. මෙතෙක් සිදුකර ඇති පර්යේෂණ සලකා බැලූ විට බිළාල පවුල තුල කළු වර්ණ දර්ශයේ පරිනාමය සැලකූ විට අවස්ථා කිහිපයක දී විශේෂ තුනක් එකිනෙකට වෙනස් විකෘති දරන බවට තහවුරු කර ඇත. එසේ වුවද ශ්‍රී ලංකාවේ කළු කොටියා ඇතුළු ඉතිරි විශේෂවල විකෘති හෝ වෙනත් වෙනස්කම් පිළිබඳ විධිමත් අධ්‍යනයක් මේ වන තෙක් සිදුකර නැත. එම නිසා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය හා එක්ව කළු කොටියා තුළ ක්‍රියාකාරී මෙලනිස්වාදය සඳහා එහි විකෘති සෑදීමේදී ඇති විය හැකි සම්බන්ධය හඳුනා ගැනීම සඳහා මෙලනින් සංස්ලේෂණ මාර්ගවල වැදගත් එන්සයිම සඳහා කේතනය කරන න්‍යෂ්ටික ජාන විකෘතියක් නිසා ඇති වූවක්දැයි පරීක්ෂා කළ අතර මේ සඳහා මියගිය කළු කොටින්ගේ හා සාමාන්‍ය වර්ණ රටාව දරන කොටින්ගේ DNA සාම්පල් විශ්ලේෂණය කරන ලදී.මෙම ප්‍රතිඵල යෝජනා කරන්නේ ASIP නම් ජානයේ ඇති වූ එක් ඇමයිනෝ අම්ල වෙනසක් (තනි නියුක්ලියෝටයිඩ බහුරූපතාව-Single Nucleotide Polymprphism), (C353A) විකෘතිය හේතුවෙන් ASIP ක්‍රියාකාරිත්වය සම්පූර්ණයෙන්ම නැතිවීම නිසා එහි ප්‍රතිඵලයක් ලෙස කළු වර්ණය සහිත කොටියෙකු ඇති වන අතර එම සතුන් කිසිසේත්ම වෙනත් විශේෂයක් නොවන බවයි. මෙම දත්ත මගින් ශ්‍රී ලංකාවේ කොටියා උප විශේෂයක් ලෙස වෙන් වූයේ මීට අවුරුදු මිලියන 0.5 කට පෙර බවත් ශ්‍රී ලංකාවේ කොටියන්ගේ ජාන විවිධත්වය ඉතා අඩු බවත් තහවුරු විය. කළු කොටියාගේ පරිසරයට අනුගත වී ජීවත් වීමට ඇති හැකියාවත් නැවත නැවත කළු කොටින් ඇතිවීමේ සම්භාවිතාවත් නිසා ශ්‍රී ලංකා කොටියාගේ කළු රූපාකාරය ඉදිරියේදීත් වාර්ථා වීමට හැක.

- **ලෝක ශාක නාමාවළියට නව ශාකයක් එක්කරමින් *Strobilanthus sripadensis* ප්‍රකාශයට පත්කිරීම**

  සමනල ස්වභාව රක්ෂිතයෙන් පමණක් හමුවී ඇති මෙතෙක් කාලයක් වාර්තා වී නොතිබූ නෙලු ශාකයක් *Strobilanthes sripadensis* නමින් නව නෙලු ශාක විශේෂයක් ලෙසට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කරන පර්යේෂකයන් විසින් සොයා ගෙන Phytotaxa නැමැති අන්තර්ජාතික පර්යේෂණ සගරාවේ පර්යේෂණ පත්‍රිකාවක් පළකිරීම මඟින් ලෝක ශාක නාම ලැයිස්තුවට නව නමක් එක්කරන ලදී.

- **කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම**

  වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ (1964 අංක 44, 1970 අංක 01, 1993 අංක 49 හා 2009 අංක 22 දරණ පනත් වලින් සංශෝධිත) 2 අ වගන්තිය දක්වා ඇති නීතිමය ප්‍රතිපාදනයන්ට අනුකූලව වෙඩිතලතිව් ස්වභාව රක්ෂිතය සඳහා කළමනාකරණ සැලැස්ම පිළියෙල කරණ ලදී. මෙය ක්‍රියාත්මක කරන කාලසීමාව 2024 - 2028. වේ.

- **2023 වසරේදී කොටි සංරක්ෂණය හා කොටින් නිසා මිනිසුන් වෙත ඇතිවන සෘණාත්මක බලපෑම අවම කිරීම සඳහා පහත වැඩසටහන් දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලදී.**

  කොටින් හා මිනිසුන් අතර ඇති සෘණාත්මක බලපෑම් උත්සන්නව පවතින අඔගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීන් ඇතුළු රජයේ නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම .

  කොටි මිනිස් ගැටුම අවම කිරීම සඳහා අඔගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටා ඇති වතු සමාගම්වල කළමනාකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 04 ක් පැවැත්වීම (සංඛ්‍යාව 140).

  ප්‍රජාව දැනුවත් කිරීම මඟින් කොටි සහ මිනිසුන් අතර ඇතිවන සෘණාත්මක බලපෑම අවම කිරීම හා බඹර දෙබර සම්බන්ධයෙන් ඇතිවන ගැටළු අවම කිරීමට හග්ගල අඩවි ආරක්ෂක කාර්යාලය මඟින් දැනුවත් කිරීමේ වැඩසටහන් 08 ක් පැවැත්වීම.

  කොටි සංරක්ෂණය කිරීම සහ කොටින්ගේ වාසස්ථාන ආශ්‍රිතව ජීවත්වන ප්‍රජාව වෙත කොටින් නිසා ඇති වන සෘණාත්මක බලපෑම අවම කිරීම සඳහා එම බලපෑම් උත්සන්නව පවතින ප්‍රදේශ වල වනජීවී නිලධාරීන් 25 දෙනෙකු සඳහා ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම.

- **WILDLANKA අන්තර්ජාතික පර්යේෂණ සඟරාව ප්‍රකාශයට පත්කිරීම**

  WILDLANKA අන්තර්ජාතික පර්යේෂණ සඟරාව දැනට වසරකට වෙළුම් 04 කින් යුතුව ප්‍රකාශයට පත්කරන අතර 2023 වසරේදී ගුණාත්මකභාවයෙන් ඉහළ දෙස් විදෙස් පර්යේෂණ පත්‍රිකා රාශියක් ප්‍රකාශයට පත්කර ඇත. එහි සංස්කාරක මණ්ඩලය පිළිගත් දෙස් විදෙස් විශ්වවිද්‍යාල ඇදුරු මණ්ඩලයකින් සහ ප්‍රවීණ විදයාඥයන්ගෙන් සමන්විතයි. මෙය දෙපාර්තමේන්තුව අන්තර්ජාතික පිළිගැනීමට ලක්වීමට මහත් පිටුවහලක් විය.

- **WILDLANKA SYMPOSIUM පැවැත්වීම**

  අන්තර්ජාතික පර්යේෂණ සැසිය 2023 වසරේ ඔක්තෝබර්19 හා 20 දෙදින පුරා "Water's Edge" හෝටලයේදී ‘‘නව සොයාගැනීම් තුලින් වනජීවී සංරක්ෂණය’’ යන තේමාව යටතේ පර්යේෂකයින් රැසකගේ සහභාගීත්වයෙන් පැවත් විය.

‘‘ වනදිවි තෙත්බිම් ’’ ප්‍රකාශයට පත්කිරීම

වනජීවී රක්ෂිත ජාලය තුළ පිහිටි තෙත්බිම්වල විස්තර ඇතුලත් කරමින් ‘‘ වනදිවි තෙත්බිම් ’’ වාරික දෙකක් 2023 පෙබරවාරි හා ඔක්තෝබර් මාසවලදී ප්‍රකාශයට පත්කරන ලදී.

- **වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ Blue Green Media යූ ටියුබ් චැනලය සඳහා 2023 වසරට අදාළව නිෂ්පාදනය කළ වැඩසටහන්**

  2023 ජනවාරී 02 - Blue Green Media Heritage චැනලය සඳහා සකස් කළ ආරක්ෂිත ශාක සම්බන්ධ කෙටි වීඩියෝ වැඩසටහන් මාලාවේ නිල් බිනර පිළිබඳ වැඩසටහන

  2023 ජනවාරී 18 - Blue Green Media Documentary චැනලය සඳහා සකස් කළ සිරිලක කොරල් පාරාදීසයට ගමනක් - පරෙවි දූපත ජාතික උද්‍යානය පිළිබඳ වාර්තාමය වැඩසටහන

  2023 පෙබරවාරී 09 - Blue Green Media Current Affairs චැනලය සඳහා සකස් කළ ලෝක තෙත් බිම් දිනය පිළිබඳ විද්වත් සාකච්ඡාව (සහභාගීත්වය මහාචාර්යය සෙව්වන්දි ජයකොඩි මහත්මිය, මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ (ස්වභාවික සම්පත් කළමනාකරණ) ප්‍රියංගනි ගුණතිලක මහත්මිය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (රක්ෂිත ප්‍රදේශ කළමනාකරණ) මංජුල අමරරත්න මහතා)

  2023 මාර්තු 01 - Blue Green Media Current Affairs චැනලය සඳහා සකස් කළ ලෝක මුහුදු තෘණ බිම් දිනය පිළිබඳ විද්වත් සාකච්ඡාව (සහභාගීත්වය වයඹ විශ්ව විද්‍යාලයේ මහාචාර්යය සෙව්වන්දි ජයකොඩි මහත්මිය, විදේශ කටයුතු අමාත්‍යාංශයේ සමුද්‍ර කටයුතු පාරිසරික හා දේශගුණික විපර්යාස අංශයේ අධ්‍යක්ෂ රිෆා වඩූඩ් මහතා, මුහුදු තෘණ විශේෂඥ හා IUCN සාමාජික සුසන්ත උඩගෙදර මහතා, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (රක්ෂිත ප්‍රදේශ කළමනාකරණ) මංජුල අමරරත්න මහතා)

  2023 මාර්තු 21 - Blue Green Media Current Affairs චැනලය සඳහා සකස් කළ ලෝක වනාන්තර දිනය පිළිබඳ විද්වත් සාකච්ඡාව (සහභාගීත්වය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිසර කලමනාකරණ හා භූ සංරක්ෂණ අංශයේ වන සංරක්ෂක ප්‍රියන්ත සේනාරත්න මහතා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය ආචාර්යය තිලක් චන්ද්‍රතිලක මහතා, පරිසර අමාත්‍යාංශයේ පරිසර ප්‍රතිපත්ති හා සැලසුම් අංශයේ අතිරේක ලේකම් පද්මා අබේකෝන් මහත්මිය)

  2023 මැයි 22 - Blue Green Media Current Affairs චැනලය සඳහා සකස් කළ ලෝක ජෛව විවිධත්ව දිනය පිළිබඳ විද්වත් සාකච්ඡාව (සහභාගීත්වය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය බුද්ධි මාරඹේ මහතා, Biodiversity Sri Lanka ආයතනයේ ජ්‍යෙෂ්ඨ උපදේශිකා හා ශ්‍රී ලංකා පාරිසරික වෘත්තීයවේදීන්ගේ ආයතනයේ සභාපතිනි ශ්‍රියානි යසරත්න මහත්මිය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (රක්ෂිත ප්‍රදේශ කළමනාකරණ), මංජුල අමරරත්න මහතා).

  2023 ජූනි 05 - Blue Green Media Current Affairs චැනලය සඳහා සකස් කළ ලෝක පරිසර දින විද්වත් සාකච්ඡාව - Beat Plastic Pollution (සහභාගීත්වය පරිසර අමාත්‍යාංශ ලේකම්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා, වයඹ විශ්ව විද්‍යාලයේ මහාචාර්යය සෙව්වන්දි ජයකොඩි මහත්මිය)

2023 ජුනි 14 - Blue Green Media Current Affairs චැනලය සඳහා සකස් කළ වනජීවී ඡායාරූපකරණයට ප්‍රවේශයක් විද්වත් සාකච්ඡාව (සහභාගීත්වය ප්‍රවීන ඡායාරූප ශිල්පී අතුල රණරාජා මහතා, ප්‍රවීන ඡායාරූප ශිල්පී ප්‍රසාද් හපුආරච්චි මහතා, ප්‍රවීන ඡායාරූප ශිල්පී මෙන්ඩිස් වික්‍රමසිංහ මහතා)

2023 ජුලි 21 - Blue Green Media Documentary චැනලය යටතේ Wild traveler සංචරණ වැඩසටහනේ එරත්න මං පෙතින් සමනල සොබා අගය සොයා - සමනල ස්වභාව රක්ෂිතය හා සිරිපා වන්දනාව සමග බැදුණු වාර්තාමය වැඩසටහන

2023 ජුලි 31 - Blue Green Media Current Affairs චැනලය සඳහා සකස් කළ ලෝක අඩවි ආරක්ෂක වරුන්ගේ දිනය පිළිබඳ විද්වත් සාකච්ඡාව (සහභාගීත්වය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අඩවි ආරක්ෂක රත්නසිරි පෙරේරා මහතා, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අඩවි වන නිලධාරී එන්.ටී.පී. කරුණාරත්න මහතා)

2023 අගෝස්තු 15 - Blue Green Media Current Affairs චැනලය සඳහා සකස් කළ වනජීවී ඡායාරූපකරණ වැඩමුළුව හෝර්ටන්තැන්න පළමු කණ්ඩායමේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳ කෙටි වීඩියෝව

2023 ඔක්තෝබර් 13 - Blue Green Media හරිත අරුත චැනලය සඳහා සකස් කළ Across the green table වැඩසටහනේ ප්‍රවීන පක්ෂි විදුවර දීපාල් වරකාගොඩ මහතා සමඟ සිදු කළ පක්ෂීන් අධ්‍යයනය පිළිබඳ විද්වත් සාකච්ඡාව

2023 ඔක්තෝබර් 27 - Blue Green Media Current Affairs චැනලය සඳහා සකස් කළ "Wild Lanka Symposium 2023 Keynote Address By Dr. Rohan Petiyagoda" ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකස් කළ විද්වත් සාකච්ඡාව

2023 ඔක්තෝබර් 27 - Blue Green Media හරිත අරුත චැනලය සඳහා සකස් කළ Across the green table වැඩසටහනේ ආචාර්යය රෝහාන් පෙතියාගොඩ මහතා සමඟ සිදුකළ ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය පිළිබඳ ඉංග්‍රීසි මාධ්‍යයේ විද්වත් සාකච්ඡාව

2023 නොවැම්බර් 28 - Blue Green Media හරිත අරුත චැනලය සඳහා සකස් කළ Across the green table වැඩසටහනේ ප්‍රවීන ඡායාරූප ශිල්පී සඳුන් ජයවර්ධන මහතා සමඟ සිදු කළ ඡායාරූප කලා ඉතිහාසය පිළිබඳ විද්වත් සාකච්ඡාව

2023 දෙසැම්බර් 22 - Blue Green Media Heritage චැනලය සඳහා සකස් කළ කොරල් සම්බන්ධ කෙටි වීඩියෝ වැඩසටහන් මාලාවේ Acropora පිළිබඳ වැඩසටහන

2.5 දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අපේක්ෂිත ඉලක්කයන් හා පවතින අභියෝග

අ/අ	ඉදිරි ඉලක්ක		අභියෝග
1	වනසත්ත්ව - මිනිස් ගැටුම් අවම කිරීම	1. පවතින විදුලි වැටවල් වලින් කි.මී. 735.22 ක් නඩත්තු කර පවත්වාගෙන යාම. 2. නව විදුලි වැට කි.මී. 239.39 ක් ඉදි කිරීම.	• භෞතික හා මානව සම්පත් අවශ්‍යවීම. • විදුලි වැට ඉදිකිරීමේදී ඉඩම් සම්බන්ධව ගැටළු ඇතිවීම හා මහජන විරෝධතා ඇතිවීම • ඉඩම් සම්බන්ධ ගැටළු විසඳීමේදී ඊට සම්බන්ධවන ආයතන (වන සංරක්ෂණ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වැනි) අතර පවතින අන්තර් සම්බන්ධතාවයේදී මුහුණදීමට සිදුවන ගැටළු • විදුලි වැට උපකරණ ආනයනය කිරීමේදී අදාළ ආයතනවලින් සිදුවන ප්‍රමාදයන්. • උද්‍යානය තුළ පවතින මාර්ග පද්ධතියේ පවතින අඩුපාඩු නිසා සිදුවන ප්‍රවාහන අපහසුතා
2	රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය	1. රක්ෂිත ප්‍රදේශවල හෙක්.356.45 ක වාසස්ථාන සුපෝෂණය සිදු කිරීම. 2. ජල ප්‍රභවයන් 05 ක් ප්‍රතිසංස්කරණය කිරීම.	• කාලගුණික හා දේශගුණික විපර්යාසයන් ජයගැනීම තුළින් අපේක්ෂිත මට්ටමට ලඟාවීම • රක්ෂිත ප්‍රදේශ තුළ සංවර්ධන කටයුතු සිදු කිරීමේදී පවතින දුර හා නවාතැන් ගැනීමට අපහසුවීම හේතුවෙන් ඉටුකරන වැඩ කොටස සීමිත වීම
3	වනජීවී සෞඛ්‍ය ඒකකවල පහසුකම් වැඩිදියුණු කිරීම	1. පීඩාවට පත්වන වනසතුන්ට ප්‍රතිකාර කිරීමට වනජීවී සෞඛ්‍ය ඒකකවල පහසුකම් වැඩිදියුණු කිරීම.	• වන සතුන්ට ප්‍රතිකාර කිරීම සඳහා ගුණාත්මක භාවයෙන් යුතු ඖෂධ දේශීය වෙළඳපල තුළ හිඟ වීම • දේශීය වෙළඳපල තුළ වෛද්‍ය උපකරණ හිඟය

			• වෛද්‍ය උපකරණ ආනයනය කිරීමට සිදුවන නිසා අධික පිරිවැයක් දැරීමට සිදුවීම
4	වනජීවී අපරාධ මැඩලීම සඳහා යාන්ත්‍රණය ශක්තිමත් කර පවත්වාගෙන යාම	1. GPS, GIS වැනි නව තාක්ෂණ ක්‍රමවේද භාවිතය වැඩිදියුණු කිරීම. 2. වනසත්ත්ව වෘක්ෂලතා ආඥා පනත සහ උසාවි කාර්ය පටිපාටිය සම්බන්ධව නිලධාරීන් දැනුවත් කිරීම. 3. වනජීවී අපරාධ මැඩලීම සඳහා වර්තමානයට ගැලපෙන පරිදි වනසත්ව හා වෘක්ෂලතා ආඥා පනත සංශෝධනය කිරීම හා නව නීති ඇතුළත් කිරීම. 4. වනජීවී අපරාධ මැඩලීම සඳහා තොරතුරු ලබාගැනීමට බුද්ධිමය ඒකකයක් ස්ථාපිත කිරීම.	• ක්ෂේත්‍රය පිළිබඳ අත්දැකීම් බහුල පුහුණු නිලධාරීන් ප්‍රමාණවත් නොවීම
5	රක්ෂිත ප්‍රදේශ අවට ජනතාව සංරක්ෂණයට දායක කර ගැනීම	1. ග්‍රාමීය ජනතාවගේ වනජීවී සංරක්ෂණය උදෙසා ආකල්ප වර්ධනය කිරීම උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. 2. ග්‍රාමීය ජනතාව සවිබල ගැන්වීම සඳහා පුහුණු වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.	• ජනතාවගේ අවශ්‍යතා විවිධ වීම සහ සතුන් සහ මිනිසුන් අතර සහජීවනයකින් ගැටුම් අවම කර ගැනීමට අවශ්‍යතාවයක් නොවීම
6	පාරිසරික සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම	1. ජාතික උද්‍යානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම (මාර්ග/ සනීපාරක්ෂක	• ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී සැලසුම්කල කාලසීමාව තුළ අදාළ නීති රීති රාමුවතුළ ක්‍රියාත්මක


		පහසුකම් දියුණු කිරීම සංචාරක නිවාසවල තත්ත්වය). 2. සංචාරකයින් සඳහා නව ඊ - සේවාවන් ප්‍රවර්ධනය කිරීම (e-permitting /e-booking). 3. ස්වේච්ඡා මාර්ගෝපදේශකයින් සහ ජීප් රථ රියදුරන්ගේ සේවයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින් වැඩමුළු පැවැත්වීම.	කිරීමේ ප්‍රමාදයන් • සංචාරකයින් වැඩිපුර පැමිණෙන කාලසීමාව තුළ සංචාරකයින්ගේ උපරිම ධාරිතාවයට අනුගතවන පරිදි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන අපහසුතා • තාක්ෂණ කටයුතුවලදී මුහුණ දීමට සිදුවන අපහසුතාවයන් • කාලගුණික හා දේශගුණික විපර්යාසයන් ජයගැනීම තුළින් අපේක්ෂිත මට්ටමට ළඟාවීම
7	දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය	1. වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත ක්‍රියාත්මක කිරීමට නිලධාරීන් පුහුණු කිරීම. 2. ගිරිතලේ ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු ආයතනය අන්තර්ජාතික පුහුණු ආයතනයක් ලෙස සංවර්ධනය කිරීම. 3. රන්දෙණිගල Tree Center පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය. 4. දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීමේ හැකියා වර්ධනය කිරීම.	• සීමිත කාර්යය මණ්ඩලයක් සිටින බැවින් නිරන්තර පුහුණුවට යෙදවීම අපහසු වීම • කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීමේ දී අනපේක්ෂිතව ඇතිවන දුෂ්කරතා

8	අන්තර්ජාතික සම්මුතීන් ක්‍රියාත්මක කිරීම	1. CITES, RAMSAR, CMS අන්තර්ජාතික සම්මුතීන් ක්‍රියාත්මක කිරීම. 2. CITES බලපත්‍ර නිකුත් කිරීමේ ඉ- සේවාව ප්‍රචලිත කිරීම.	• සාමාන්‍ය ජනතාව අතර මෙම අන්තර් ජාතික සම්මුතීන් පිළිබඳ අවබෝධයක් නොවීම
9	ස්වභාවික ආපදාවන්ගෙන් වනජීවීන්ට සිදුවන හානි අවම කිරීම	1. ගිනි ගැනීම් සහ පැතිරීම අවම කිරීමට වනජීවී රක්ෂිත තුළ ගිනි පටි ඉදි කිරීම. 2. නියං සමයේ ජල අවශ්‍යතාවයන් සඳහා රක්ෂිත තුළ කෘතිම වතුර වලවල් ඉදිකිරීම සහ පවතින ජල ප්‍රභවයන් සංවර්ධනය කිරීම.	• අනපේක්ෂිත කාලගුණික තත්වයන් කොන්ත්‍රාත්කරුවන් වැඩ අවසන් කිරීමේදී සිදුවන ප්‍රමාදයන්

පරිච්ඡේදය - 03

මූල්‍ය ප්‍රගතිය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය




ඒසීජී-ඊෆ්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ගුණාංග 2023 රු.		සටහන අ	2023 රු.	2022 රු.	
19,000,000	ආදායම් ලැබීම්		50,026,598	26,791,472	
0	ආදායම් බදු	1		0	
0	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2		0	ඇමු-1
0	ජාතාන්තර වෙළඳාම මත බදු	3		0	
19,000,000	බදු නොවන ආදායම් හා ලාභාංශ	4	50,026,598	26,791,472	
19,000,000	මුළු ආදායම් ලැබීම් (අ)		50,026,598	26,791,472	
5,558,197,248	ආදායම් නොවන ලැබීම්		5,608,143,526	3,642,867,650	
481,000,000	භාණ්ඩාගාර ණය		493,000,000	1,806,060,000	ඇමු-1
5,103,197,248	ණයකරු		5,103,197,248	1,772,159,910	ඇමු-4
52,000,000	අත්තිකාරම් හිඟුම්		311,946,277	64,647,740	ඇමු-5
	වෙනත් ප්‍රධාන ලෙජර් හිඟුම් ලැබීම්			0	
5,558,197,248	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		5,608,143,526	3,642,867,650	
5,577,197,248	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		5,658,170,123	3,669,659,122	
	සංස්ථාගතවලට සල්ලාභ (ඇ)		1,100,253,665	0	
5,577,197,248	ඉදිරි ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		4,557,916,458	3,669,659,122	
	අඩු කළා : ව්‍යාපෘති				
2,157,000,000	ප්‍රාග්ධනීකරණ ව්‍යාපෘති		2,078,777,596	2,013,459,073	
1,349,000,000	පැවැත්, පරිහරණ සහ අනෙකුත් සේවාවල ප්‍රතිලාභ	5	1,329,379,609	1,326,919,738	
643,000,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	601,660,286	576,793,629	ඇමු-2(ii)
164,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	147,242,781	109,715,706	
0	පොළී ගෙවීම්	8		0	
1,000,000	වෙනත් ප්‍රාග්ධනීකරණ ව්‍යාපෘති	9	495,000	30,000	
2,157,000,000	මුළු ප්‍රාග්ධනීකරණ ව්‍යාපෘති (ඊ)		2,078,777,596	2,013,459,073	
260,000,000	මූල්‍යයන ව්‍යාපෘති		215,456,154	148,006,591	
	මූල්‍යයන වගකීම් ප්‍රාග්ධ්‍යාංශගත කළ				
22,000,000	පැවිලුණු කිරීම්	10	21,241,196	15,505,589	
106,000,000	මූල්‍යයන වගකීම් අත්තිකාරම් කර ගැනීම්	11	87,574,294	67,945,298	
0	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඇමු-2(ii)
0	මූල්‍ය වගකීම් අත්තිකාරම් කර ගැනීම්	13	-	-	
7,000,000	තැන්පත් වර්ධනය	14	7,000,000	4,766,043	
125,000,000	වෙනත් මූල්‍යයන ව්‍යාපෘති	15	99,640,664	59,789,660	
260,000,000.00	මුළු මූල්‍යයන ව්‍යාපෘති (උ)		215,456,154	148,006,591	
2,819,177,214	තැන්පතු ගෙවීම්		2,819,177,214	1,514,407,724	ඇමු-6
50,000,000.00	අත්තිකාරම් ගෙවීම්		92,983,784	60,114,728	ඇමු-5
48,661,142	ඵැට ගෙවීම්		(48,661,142)	(29,207,270)	
	වෙනත් ප්‍රධාන ලෙජර් හිඟුම් ගෙවීම්			-	
2,820,516,072	ප්‍රධාන ලෙජර් ව්‍යාපෘති (උ)		2,863,499,856	1,545,315,183	
5,237,516,072	මුළු ව්‍යාපෘති ග = (ඊ+උ+උ)		5,157,733,606	3,706,780,846	
339,681,176	දෙසැම්බර් 31 දිනට ශේෂය ච = (ඉ-ග)		(599,817,148)	(37,121,723)	
	අයිති ඇරඹුම් ප්‍රශ්නය අනුව ශේෂය		(599,817,148)	(37,121,723)	ඇමු-7
	දෙසැම්බර් 31 දිනට අයිති ශේෂය		-	-	ඇමු-3
		1	-	-	

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය



2023 මාර්තු 31 දිනට

	සටහන	2023	2022
		රු.	රු.
ස්ථිර වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	ස්ථි.ප-6	32,459,545,844	32,371,971,551
ස්ථිර නොවන			
අත්කරගත් නිශ්චිත	ස්ථි.ප-5(f)	234,884,694	243,047,187
මිලදී ගැනීම් පවතින ය	ස්ථි.ප-3		
මුළු වත්කම්		32,694,430,538	32,615,018,738
සැපයීම්කරුවන් / ණයකරුවන්			
භාණ්ඩාගාරය වෙත ඇදුම් ගෙවීමේ		(8,917,035,365)	(6,634,877,383)
දේපල පිරියත හා උපකරණ ය-පිරිය		32,459,545,844	32,371,971,551
ඇපයි හා වැඩ අත්කරගැනීම් ය-පිරිය	ස්ථි.ප-5(f)		
වත්කම් වගකීම්			
තැන්පතුකරුවන්	ස්ථි.ප-4	9,151,120,082	6,887,124,456
අනුමත පාරිභෝගිකයන්	ස්ථි.ප-3		
මුළු වගකීම්		32,693,630,538	32,615,018,738


මිලු අංක 07 සිට 34 දක්වා ස්ථි.ප 1 සිට ස්ථි.ප 7 දක්වා යු ආකෘති පසුබිමේ අදිනියේ සහගතය කිරීමේ සාධාරණ සහ ආයතනික මිලු අංක 35 සිට 77 දක්වා අනුකූල කිරීමේ සාධාරණ ස්ථිරයට ද සමඟ අධිකාරී කිරීමේ සහතික කරන්නේ ය. සමඟ මූල්‍ය ප්‍රකාශය සිදුවෙලා සිටින සහගත මිලියන් කිරීමේ කිරීමේ මූල්‍ය ප්‍රකාශනවලින් සාධාරණ ස්ථිරයට සහ ඇති පරිදි රීතියන් මූල්‍ය කිරීම්කරණය ප්‍රතිශතවල සාධාරණ ය. මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ ස්ථිරයට සහ අනෙකුත් කිරීමේ සාධාරණ, මිට අදාළ කිරීමේ සාධාරණ සහ අනෙකුත් කිරීමේ සාධාරණ, සාමාන්‍යයෙන් කිරීමේ සාධාරණ සහ ඇති රීතියන් මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ ස්ථිරයට සහ ඇති පරිදි රීතියන් මූල්‍ය කිරීම්කරණය ප්‍රතිශතවල සාධාරණ ය.

මූල්‍ය ප්‍රකාශය සඳහා රාජ්‍යයේ අනුමතයන් සාධාරණ ස්ථිරයට සහ අනෙකුත් කිරීමේ සාධාරණ සහ ඇති පරිදි රීතියන් මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ ස්ථිරයට සහ අනෙකුත් කිරීමේ සාධාරණ සහ ඇති පරිදි රීතියන් මූල්‍ය කිරීම්කරණය ප්‍රතිශතවල සාධාරණ ය.

Gunadasa Somarasinghe
Secretary
Ministry of Wildlife and Forest
Resources Conservation

2

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය



	2023	2022
	49,039,848	36,420,599
	-	-
	-	-
	72,688,399	70,379,668
	403,000,000	1,806,000,000
	186,049,611	67,787,537
	5,103,397,248	1,772,155,910
	5,714,615,806	3,742,807,707
	1,560,881,634	1,397,148,397
	11,877,007	11,697,532
	2,241,149	333,362,281
	495,000	30,000
	1,300,253,605	-
	93,894,224	60,202,308
	2,809,177,214	1,514,407,724
	5,567,819,994	3,718,408,234
	146,795,812	24,399,473
	-	-
		-
		-
		-
	-	-
	215,456,154	53,606,743
	215,456,154	53,606,743
	(215,456,154)	(53,606,743)
	(68,660,342)	(29,207,270)
		-
		-
		-
	-	-
		-
		-
	(68,660,342)	(29,207,270)
	(68,660,342)	(29,207,270)
	68,660,342	29,207,270
		-
		-
	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් - අදාල නොවේ

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය **(රු,000)**

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රු)	අවසන් ඇස්තමේන්තුව (රු)	ප්‍රමාණය (රුපියල්)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
6000-0-0-6-20	වන සත්ත්ව සංරක්ෂණ අරමුදල	4,353,295	5,058,557	5,059,199	100
2003-02-06	බංගලා ගාස්තු	19,000	19,000	50,027	263

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය - ඒකාබද්ධ අරමුදල **(රු,000)**

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම (රු)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන (රු)	අවසන් ප්‍රතිපාදන (රු)		
පුනරාවර්තන	2,157,000	2,157,000	2,078,778	96.37
ප්‍රාග්ධන	260,000	260,000	215,456	82.86

3.7 වන සත්ත්ව සංරක්ෂණ අරමුදල **(රු,000)**

වියදම් ඛාණ්ඩය	මුල් ප්‍රතිපාදන (රු)	අවසන් ප්‍රතිපාදන (රු)	සත්‍ය වියදම් (රු)	උපයෝගී කරගනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
පුනරාවර්තන	2,272,800	2,099,720	2,098,894	100
ප්‍රාග්ධන	997,000	574,960	574,892	100

3.7.1 වනසත්ත්ව සංරක්ෂණ අරමුදල

2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යසාධන ප්‍රකාශය

විස්තරය	ආදායම් (රුපියල්) - 2023	ආදායම් (රුපියල්) - 2023
ආදායම්		
උද්‍යාන පිවිසුම් ගාස්තු	4,040,530,285	1,283,495,906
සේවා ගාස්තු	585,828,816	238,736,089
වාහන ඇතුලත් කිරීමේ ගාස්තු	79,300,280	43,729,650
සන්නිවේදන ගාස්තු	-	-
බංගලා වල රෙදිපිළි කුලියට දීම	11,591,376	5,285,388
කඳවුරු බිම් ගාස්තු	2,583,633	1,339,239
පරිත්‍යාග ලැබීම්	4,051,652	4,531,031
පොත්පත් පෝස්ටර් සංයුක්ත තැටි හා පත්‍රිකා,කැසට් හා සුභ පැතුම්පත් ප්‍රකාශන ගාස්තු	520,939	491,737
ශාක සත්ව කොටස් ආනයන අපනයන බලපත්‍ර	2,305,400	2,060,500
උසාවි දඩ මුදල්	91,609,000	50,423,000
කැපකරු මාපිය ක්‍රමය	32,673,270	12,707,201
අලි ඇතුන් ලියාපදිංචි කිරීම	-	-
ඇත් දළ ලියාපදිංචිය	80,500	5,500
උද්‍යාන රූගත කිරීම්	4,705,179	4,487,224
දැව සහ දර විකිණීම	-	372,023
ධිවර බලපත්‍ර	2,776,729	47,035
වැලි ගොඩ දැමීමේ බලපත්‍ර ගාස්තු	28,246,200	24,462,518
ඇත් අතුරු සෙවණ පහසුකම් ගාස්තු	104,240,308	24,973,731
වෙනත් ආදායම්	768,147	-
ආයෝජන මත පොළිය	218,346,877	121,597,452
පොළිය-ඉතිරි කිරීමේ ගිණුම	232	260
මුළු ආදායම	**5,210,158,821**	**1,818,745,484**

විස්තරය	වියදම් (රුපියල්) 2023	වියදම් (රුපියල්) 2023
වියදම්		
ස්වේච්ඡා මාර්ගෝපදේශක දීමනා	94,571,615	71,254,797
ගමන් වියදම්	107,024,180	93,371,206
ඉන්ධන	162,978,902	76,458,515
ප්‍රසාද දීමනා (උසාවි දඩ මුදල් ලැබීම් වලින්)	61,747,176	41,669,849
අලි පිළිස්සීම්	5,189,764	3,725,995
මහජනයාට සතුන්ගෙන් වන හානි සඳහා වන වන්දි	246,213,334	195,798,214
අලි වෙඩි මිළදී ගැනීම	289,973,073	250,333,178
අලි පළවාහැරීමේ වියදම්	10,841,229	4,853,280
සතුන් සඳහා ආහාර	135,341,139	89,095,879
සේවා ගාස්තු	585,828,816	238,736,089
වාහන අලුත්වැඩියා	155,656,028	58,121,702
විදුලිය සහ ජලය	39,511,416	14,725,069
තුවක්කු බලපත්‍ර	284,800	349,545
වඳවීමේ තර්ජනයට ලක්වී ඇති වනජීවීන් සංරක්ෂණ වියදම්	14,556,641	4,794,831
ගුවන්විදුලි පණිවුඩ	4,558,030	4,110,733
බංගලා වල රෙදි පිරිසිදු කිරීමේ වියදම්	2,484,162	1,222,936
නීතීඥ ගාස්තු	417,000	348,000
විවිධ වියදම්	79,948,904	41,730,690
යන්ත්‍ර උපකරණ, විදුලි උපකරණ ,ගොඩනැගිලි යනාදිය නඩත්තුව	74,200,913	16,000,023
වෛද්‍ය සැපයීම්	16,746,220	4,212,276
ජාතික උද්‍යානවල කාර්යාලයීය වියදම්	18,934,011	6,644,253
නිලධාරීන්ගේ රෝහල් හා වෛද්‍ය ගාස්තු	139,562	-
නිලධාරීන්ගේ ජීවිත හා ශාරීරික හානි සඳහා වන වන්දි	3,694,800	475,000
උද්‍යානවල සංචාරකයින්ගේ හා සතුන්ගේ පහසුකම් වැඩි	52,936,840	2,526,770

දියුණු කිරීම		
යන්ත්‍රෝපකරණ,වාහන සහ බෝට්ටු මිලදී ගැනීම	5,047,312	2,680,341
සංචාරක නිවාස පවත්වාගෙනයාම	18,539,920	18,456,862
විදේශීය පුහුණු	4,564,001	3,859,464
දිරි දීමනා	116,387,553	122,130,692
සම්මුති සම්මන්ත්‍රණ	5,926,525	3,113,053
ප්‍රධාන කාර්යාලය වැඩි දියුණු කිරීම	-	-
ජනවිඥාපනය	6,931,759	1,842,671
සමුද්‍රජීවී සංරක්ෂණය	6,146,731	246,196
වාසස්ථාන සුපෝෂණ කටයුතු	57,621,114	19,601,363
විදුලි වැට නඩත්තු	117,127,113	-
නඩත්තු සේවක කුටි සඳහා අවශ්‍ය උපකරණ	-	76,950
නඩත්තු සේවක ආහාර දීමනා	47,620,416	47,174,972
නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය උපකරණ	1,571,070	3,242,062
විදුලි වැට ඉදිකිරීම	-	3,352,308
කාර්යාල උපකරණ	88,000	100,692
අධ්‍යාපන හා ව්‍යාප්තති කටයුතු	2,014,077	25,000
මෘදුකාංග පද්ධති නිර්මාණය කිරීම	-	-
දේශීය පුහුණු	16,398,125	9,545,743
බැංකු ගාස්තු	342	-
එකතුව	**2,569,762,610**	**1,456,007,201**

විස්තරය	ක්ෂය(රුපියල්) 2023	ක්ෂය(රුපියල්) 2023
ක්ෂය		
රථ වාහන	10,403,320	10,403,320
ආයතන ව්‍යුහය වැ/දි/කි	10,156,267	9,593,747
ගොඩනැගිලි	31,344,956	30,855,062
සත්ව කූඩු	1,524,335	1,524,334
කාර්යාල උපකරණ	9,529,143	5,994,032
ගුවන් විදුලි පණිවුඩ උපකරණ	-	-
පෝස්මෝටම් උපකරණ	-	-
බෝට්ටු	1,611,986	662,007
කන්ටේනර් පෙට්ටි	525,363	525,363
ගිනිඅවි	2,830,073	2,830,072
වතුර මෝටර	150,566	150,566
මෘදුකාංග පද්ධතිය	10,497,391	10,478,847
විදුලි වැට නඩත්තු උපකරණ	2,843,513	2,843,513
මුරකුටි ඉදිකිරීම	22,390,037	22,203,283
වෛද්‍ය උපකරණ	18,818,920	16,565,911
මුළු වියදම	**2,692,388,479**	**1,570,637,259**
අතිරික්තය	**2,517,770,342**	**248,108,226**
එකතුව	**5,210,158,821**	**1,818,745,484**

3.7.2 මු.රෙ 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රුපියල්,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		සත්‍ය වියදම (රු)	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් ප්‍රතිපාදන වල %
			මුල් ප්‍රතිපාදන (රු.)	අවසාන ප්‍රතිපාදන (රු.)		
1	සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය	බුන්දල ජාතික උද්‍යානයේ සංචාරක පහසුකම් මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීම සහ පරවි දූපත ජාතික උද්‍යානයේ	19,890	1,396	1,396	7.02

		වැසිකිළි සංකීර්ණය ඉදි කිරීම				
2	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	විශ්‍රාම ගන්නා අවස්ථාවේදී රජයට අය විය යුතු මුදල් සඳහා	845.2	845.2	845.2	100

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රුපියල්,000

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2023** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2023** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.)
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	2023 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණ සිදු කරමින් පවතී.	644,652
9152	යන්ත්‍රෝපකරණ		825,443
9153	ඉඩම්		30,989,450

3.9 විගණකාධිපති ගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය / எனது இல. / My No. } එන්ඩබ්ලව්/සී/වීඩබ්ලිව්/02/23/09

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 මැයි 31/ දින

අධ්‍යක්ෂ ජනරාල්

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 284 - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තක්ස්වාගණනය කළ මණ්ඩලය**

ශීර්ෂ 284 - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තක්ස්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමිණාන්මක නිෂ්ඵලීකරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරි දිනයක නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව රටා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තක්ස්වය සහ එදිනෙන් අවසන් වර්ෂය

සඳහා එම මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සහය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සහය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එම ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකපිළිසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්පන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවිවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල වපුනය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල වපුනය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 පුනරාවර්තන වියදම්

2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය මූල්‍ය මාර්ගෝපදේශයේ 3.5 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබීම හේතුවෙන් එහි ඒසිඒ 2(ii) ආකෘතියේ ඇතුළත් රු.1,291,439,650

ක් වූ වැටුප්, වේතන හා අනෙකුත් සේවක ප්‍රතිලාභ රු.1,329,379,609 ක් වශයෙන් රු.37,939,959 ක් වැඩියෙන්ද, රු.639,600,165 ක් වූ අනෙකුත් භාණ්ඩ හා සේවා වියදම් රු.601,660,206 ක් වශයෙන් රු.37,939,959 ක් අඩුවෙන් ද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ඇතුළත් කර නිබුණි.

1.6.2 **අත්තිකාරම් ගෙවීම්**

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බි ශිඤුමේ ආඥාති 03 සේවළු ශේෂ වර්ගීකරණ සාරාංශයෙහි වසර ගණනාවක සිට පවතින නිශ්චිතව හඳුනා නොගත් රු.268,265 ක අය විය යුතු ශේෂය හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොනිබුණි.

1.6.3 **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මුදල් රෙගුලාසි 109 යටතේ වන පොත් වලින් කපා හැරීම් පිළිබඳ ප්‍රකාශනයෙහි දක්වා නිබුණු රු.698,025 ක් වන පාඩු හා අත්හැරීම්, හානි පාඩු ලේඛනයෙහි සඳහන් කර නොනිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **වියදම් කළමනාකරණය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50(ii) ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙල කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 03 ක මුළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ක සිට සියයට 57 ක් දක්වා පරාසයක ඉතිරිවීම් පවතින බවට නිරීක්ෂණය විය.

2.2 **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

2023 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේදී අවසන් කළ යුතු බවට සඳහන් කරමින් සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය විසින් බුත්දල ජාතික වතෝද්‍යානයේ නරඹන්නන් සඳහා වූ මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීමේ කාර්යය වෙනුවෙන් දෙපාර්තමේන්තුව වෙත ලබා දී නිබුණු රු.9,897,160 ක ප්‍රතිපාදනයෙන් එම කාර්යයන් සම්පූර්ණ කිරීමට නොහැකි වීම මත වර්ෂය අවසානයේ ඉතිරි වූ සියයට 85.9 ක් වූ රු.8,502,160 ක ප්‍රතිපාදනය එම අමාත්‍යාංශය වෙත ආපසු යවා නිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම පහත දැක්වේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2009 අංක 22 දරන වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ (සංශෝධන) පනත	
i. 4 වගන්තිය	සෑම ස්වභාවික රක්ෂිතයක් හා අභය භූමියක් වෙනුවෙන්ම මෙහෙයුම් සැලැස්මක් පිළියෙල කර සෑම වසර පහකට වරක්ම ඒවා ඇගයීමකට ලක් කර අවශ්‍ය වෙනස්කම් සිදු කළ යුතු වුවද මීරිස්ස, කල්පිටිය, හික්කඩුව යන සමුද්‍රීය රක්ෂිත සහ මාඳුගඟ අභයභූමිය වෙනුවෙන් එවැනි සැලසුම් පිළියෙල කර නොතිබුණි.
ii. 14 වගන්තිය	යම් ජාතික රක්ෂිත භූමියක මායිමේ සිට සැතපුම් 01 ක දූරක් ඇතුළත පෞද්ගලික හෝ රජයේ හෝ යම් තැනැත්තෙකු හෝ සංවිධානයක් විසින් අධ්‍යක්ෂ ජනරල්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව කවර ආකාරයක හෝ සංවර්ධන ක්‍රියාකාරකමක් සිදු නොකළ යුතු වුවද, එවැනි ලිඛිත අවසරයකින් තොරව හික්කඩුව සමුද්‍රීය උද්‍යානයේ ප්‍රවේශ මාර්ගය අවහිර වන පරිදි හා සමුද්‍ර උද්‍යානයට අයත් වෙරළ කලාපය තුළ අනවසර වෙළඳ ස්ථාන සහ සංචාරක විවේකී ස්ථාන ස්ථාපිත කර තිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද	මියගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා වැඩ තහනම් කළ නිලධාරීන් 81 දෙනෙකුගෙන් අය විය යුතු වර්ෂ 05 ක් ඉක්ම වූ රු.1,580,671 ක ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව

අපොහොසත් වී තිබුණි.

(ඇ)	2019 ජූනි 13 දිනැති හා අංක 01/2018 (i) දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 03 ඡේදය	සියලුම රාජ්‍ය ආයතන විසින් සපයනු ලබන්නා වූ විවිධ සේවාවන් සඳහා දැනට අය කරනු ලබා ගන්නා මුදල් සියයට 15 කින් ඉහළ දැමිය යුතු වුවද, 2012 වර්ෂයේ සිට 2023 වර්ෂය අවසන් වන විට වසර 11 ක් ගත වී තිබුණු බෝට්ටු ලියාපදිංචි ගාස්තු සංශෝධනය කිරීමට පියවර ගෙන නොතිබුණි.
(ඈ)	2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය මූල්‍ය පරිපාලන චක්‍රලේඛයේ 06 ඡේදය	මූල්‍ය ප්‍රකාශනා සිළිගෙයල කිරීමේදී නියමිත ආකෘති භාවිතා කරමින් දෙපාර්තමේන්තුවේ තොරතුරු නිවැරදිව වාර්තා කළ යුතු වුවත් හානි පාඩු ලේඛනයෙහි සඳහන් රු.1,662,317 ක හානි හා පාඩු 10 ක් මූල්‍ය ප්‍රකාශවල ඇතිඳුම් (II) ආකෘතියේ පොත්වලින් කපා හැරීම සිළිබඳ ප්‍රකාශනයෙහි දක්වා නොතිබුණි.
(ඉ)	2009 නොවැම්බර් 08 දිනැති අංක 05/2009 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 03 වන ඡේදය	සියලුම නියෝජ්‍ය අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ හා අඩවි ආරක්ෂක විසින් බිරිටු කාර්යාලවලට ලැබෙන සියලුම ගිනි අවි සම්බන්ධව තොරතුරු ඇතුලත් කර ගිනි අවි ලේඛනයක් පවත්වා ගත යුතු වුවද, පුත්තලම කලාප කාර්යාලය විසින් එවැනි ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.
(ඊ)	2012 සැප්තැම්බර් මස 06 දිනැති අංක 1774/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 12 වන නියෝගය	මුහුදු ක්ෂීරපායි සතුන් නිරීක්ෂණය කිරීම සඳහා මුහුදට රැගෙන යන සෑම මාධ්‍ය යාත්‍රාවකම දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කරනු ලැබූ ලියාපදිංචි මාර්ගෝපදේශකයෙකු සිටිය යුතු වුවද, මිරිස්ස තල්මසුන් නැරඹීම සඳහා යාත්‍රා කරන බෝට්ටු වල එවැනි මාර්ගෝපදේශකයෙකු සේවයට යොදවා නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්කගත කාර්යයන් 33 ක් සඳහා රු.7,094,700 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුත් එම කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2 විශේෂ ආධාර ව්‍යාපෘති

පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP) මගින් ලබාදුන් ආධාර සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) අනුරාධපුර සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි ගම්මාන වටා සහ කුඹුරු වටා විදුලි වැට ඉදි කිරීම සඳහා මිලදී ගන්නා ලද උපකරණවලින් අදාළ සමිතිවලට හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අනුරාධපුර හා කුරුණෑගල සහකාර අධ්‍යක්ෂ කාර්යාලවලට භාණ්ඩ නිකුත් කිරීමෙන් අනතුරුව රු.80,740,804 ක උපකරණ සහ එනජයිසර් බැල ගැන්වීම සඳහා මිලදී ගන්නා ලද රු.534,400 ක් වටිනාකමැති 12V Batteries (90Am) 16 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් භාවිතයට නොගෙන රිටිගල, මොරගොඩ හා මහ දිවුල්වැව වනජීවී බිට්ටු කාර්යාල පරිශ්‍රයන්හි අනාරක්ෂිතව ගබඩා කර තිබුණි. එසේම විදුලි වැට ඉදිකිරීම සඳහා මිලදී ගෙන තිබූ තවත් Tension Spring ඒකක 3183 කින් රු.7,817,500 ක් වටිනා ඒකක 3127 ක් සහ විදුලි වැටට සාගියක් සිදුවන අවස්ථාවකදී නාද වන රු.1,408,500 ක් වටිනා Fence voltage alarm with siren and flashlight ඒකක 09 ක් භාවිතයට නොගෙන රිටිගල හා මොරගොඩ වනජීවී බිටුවු කාර්යාල ගබඩාවන්හි පැවතුණි.

(ආ) රිටිගල වනජීවී කාර්යාලය තුළ තාවකාලිකව ඉදිකරණ ලද මඩුවක අනාරක්ෂිතව ගබඩා කර තිබූ විදුලි වැට ඉදිකිරීම සඳහා භාවිතා කරන වටිනාකම් රු.2,818,200 ක් වූ කම්බි රෝල් 154 ක් හා වටිනාකම් තක්සේරු නොකළ nut & bolt 122 ක් සොරුන් විසින් පැහැරගෙන ගොස් තිබූ බවට නිරීක්ෂණය වූ අතර එම අලාභය සඳහා වගකිව්යුතු නිලධාරීන් හඳුනාගෙන අලාභය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘති ප්‍රතිපාදන මත රු.804,858,948 ක වියදමකින් ඉදිකරන ලද ගිරිතලේ පුහුණු මධ්‍යස්ථානය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාර දී වසරකට අධික කාලයක් ගත වුවද, 2024 මාර්තු 31 දින වන විටත් කිසිදු පුහුණු ඒකී කටයුත්තක් සංවිධානය නොකර නිෂ්ක්‍රීයව තිබුණි.

3.3 කළමනාකරණ දුර්වලතා

(අ) මාදු ගඟ ආශ්‍රිතව හෙක්ටයාර් 2300 ක භූමි ප්‍රමාණයකින් යුතු දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් "මාදු ගඟ අභය භූමිය" ගාල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා තිබෙන බවට එය ප්‍රසිද්ධ කිරීමට අදාළ 2006 ජූලි 17 දිනැති අංක 1454/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි සඳහන් වරද නිවැරදි කර නිවැරදි මායිම් සලකුණු කිරීමට හා අභය භූමිය නිවැරදිව සිතියම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, 2023 වර්ෂය අවසන් වන විටත් මාදු ගඟ නැරඹීම් සඳහා පැමිණෙන සංචාරකයන්ගෙන් ප්‍රවේශපත්‍ර ගාස්තුවක් අය කිරීමටද දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ආ) 2023 ජනවාරි 01 දින සිට 2023 ජූනි 30 දක්වා කාලය තුළ නිත්තකඩුව සමුද්‍රීය උද්‍යානය නැරඹීමට පැමිණි සංචාරකයන්ගෙන් අයකළ මුළු ප්‍රවේශපත්‍ර ගාස්තුව රු.2,226,915 ක් සහ සේවා ගාස්තුව රු.2,761,362 ක් වීමෙන් ප්‍රවේශපත්‍ර ගාස්තුවට වඩා රු.534,447 කින් සේවා ගාස්තුව වැඩි වී තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව සංචාරකයන්ගෙන් අය කරන සේවා ගාස්තුව ප්‍රවේශ පත්‍ර ගාස්තුවට සාපේක්ෂව ඉහළ අගයක් වුව ද දෙපාර්තමේන්තුව විසින් සංචාරයකයන්ට සපයන සේවාවන් ඉතා අවම මට්ටමක පවතින බවට නිරීක්ෂණය විය.

(ඇ) කල්පිටිය සමුද්‍ර කලාපය ආශ්‍රිතව පවතින අධික ලවණ ගතිය නොසලකා 2020 වර්ෂයේදී රු.2,866,422 ක් වැය කර යකඩ යොදා ඉදිකර තිබුණු Dura House ගොඩනැගිල්ලේ යකඩ දිරාපත් වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට විනාශ වෙමින් පැවතුණි.

(ඈ) උඩවලව සහ යාල වනෝද්‍යානවල ඇති සංචාරක නිවාස වල පානීය ජලය නොඛිනීම, සූර්ය පැනල මඟින් ලබා දෙන විදුලිය සංචාරක නිවාසවල සාමාන්‍ය විදුලි අවශ්‍යතාවය සපුරාලීමට ප්‍රමාණවත් නොවීම, ගෘහභාණ්ඩ ඉතාමත් පැරණි තත්ත්වයේ පැවතීම, සංචාරක නිවාසවල රාජකාරී කටයුතු නිසි පුහුණුවක් නොලැබූ ස්වේච්ඡා මාර්ගෝපදේශකවරුන් විසින් සිදු කිරීම සහ සංචාරක බංගලා පූර්ණ නවීකරණයකට ලක් කිරීමට කටයුතු කර නොතිබීම යනාදී වශයෙන් සංචාරක නිවාසවල අඩුපාඩු පැවතීමත්, සෆාරි ජීප්රථ නියාමනය නොකිරීම නියා පවතින ගැටළුත් සංචාරක ආකර්ෂනය කෙරෙහි අහිතකර ආකාරයට බලපාතු ලබන බවට නිරීක්ෂණය විය.

(ඉ) 2023 වර්ෂය තුළදී විදුලි වැට ඉදිකිරීම සඳහා රු.58,640,147 ක් හා එහි නඩත්තුව සඳහා රු.14,433,552 ක් ද ඇතුළුව 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය සඳහා කාලය තුළ පමණක් විදුලි වැට සඳහා වැය කර තිබුණු මුදල රු.2,355,882,248 ක් වූ අතර 2023 දෙසැම්බර් 31 දින වන විට විදුලි වැටෙහි සම්පූර්ණ දිග ප්‍රමාණය කිලෝමීටර් 5,389.97 ක් විය. එසේ වුවද, පසුගිය වර්ෂ 05 ක් තුළ සිදු වූ අලි මරණ, මිනිස් මරණ හා දේපළ හානි සැලකීමේදී විදුලි වැට ඉදිකළ ද අලි මිනිස් ගැටුම් අවම වීමක් නිරීක්ෂණය නොවිය.

	2023	2022	2021	2020	2019	එකතුව
වන අලි මරණ	488	439	375	327	407	1,684
මිනිස් මරණ	184	145	142	113	122	560
ශාරීරික හානි	239	179	58	75	145	413
දේපළ හානි	3,429	2668	1,326	850	2,148	7,172

(ඊ) 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා තබ්බෝව අභයභූමියේ මෙක්ටයාර 315 ක කලපු අන්දර ඉවත් කර වාසස්ථාන සුපෝෂණය සඳහා රු.57,401,665 ක් ද, ඉවත් කළ ප්‍රදේශය නඩත්තුව සඳහා රු.3,346,500 ක් ද වැය කර තිබුණු නමුත්, 2023 වර්ෂය අවසන් වන විටත් විශාල භූමි ප්‍රදේශයක කලපු අන්දර වැව් තිබුණි. මේ හේතුවෙන් අලි ඇතුන්ට රක්ෂිතයෙහි රැඳී සිටීමට අපහසු වී ඔවුන් කිලෝමීටර් 50 ක් පමණ ඇත ගම්මානවලට ගමන් කරන බව නිරීක්ෂණය විය.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තරාතිරම් කාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ මට්ටමේ සුරක්ෂිතාධිකාරී 37 ක් ඇතුලුව දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ තනතුරු 977 ක් සුරක්ෂිත වී පැවතුණි.

ආර්.එම්.එම්.රස්.පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විශ්‍රාමාධිපති
විශ්‍රාමාධිපති වෙනුවට

පරිච්ඡේදය 04

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමවුම		
	100%-90%	75%-89%	50%-74%
ඉදිකළ විදුලි වැට දිග (කි.මී)	-	√	-
නඩත්තු කළ විදුලි වැට දිග (කි.මී)	-	√	-
අළුත්වැඩියා කරන ලද ජල ප්‍රභවයන් (සංඛ්‍යාව)	√	-	-
වාසස්ථාන සුපෝෂණය කළ බිම් ප්‍රමාණය (හෙක්.)	-	-	√
ස්ථාපිත කරන ලද දැන්වීම් පුවරු (සංඛ්‍යාව)	-	√	-
අළුත්වැඩියා කරන ලද ගොඩනැඟිලි (සංඛ්‍යාව)	√	-	-
අළුත්වැඩියා කරන ලද මාර්ගවල වල දුර (කි.මී)	-	√	-
අළුත්වැඩියා කරන ලද සපත්තු පාලම් (සංඛ්‍යාව)	-	-	√
අළුත්වැඩියා කරන ලද සංචාරක බංගලා (සංඛ්‍යාව)	-	-	√
වැඩිදියුණු කරන ලද සනීපාරක්ෂක පහසුකම් (සංඛ්‍යාව)	√	-	-
වැඩි දියුණු කරන ලද ජල සැපයුම් පද්ධති (සංඛ්‍යාව)	√	-	-
වැඩිදියුණු කරන ලද විදුලි සැපයුම් පද්ධති (සංඛ්‍යාව)	√	-	-
යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම (සංඛ්‍යාව)	-	√	-
ක්‍රියාත්මක කළ ජනවිඥාපනකරණ වැඩසටහන් (සංඛ්‍යාව)	√	-	-
මිලදී ගන්නා ලද අලි වෙඩි (සංඛ්‍යාව)	√	-	-
නිෂ්පාදනය කරන ලද ගිණි අවි රඳවන (සංඛ්‍යාව)	-	√	-
සවි කරන ලද ගිණි අවි රඳවන (සංඛ්‍යාව)	-	-	√
කෙටි කාලීන පුහුණු වැඩසටහන් (සංඛ්‍යාව)	√		-
වනජීවී සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්	√	-	-
දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සිදුකරන ලද වනජීවී සංරක්ෂණය පිළිබඳ පර්යේෂණ (සංඛ්‍යාව)	√	-	-

පරිච්ඡේදය 05

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය %		
			0-49	50-74	75-100
14. සාගර මුහුදු හා සාගර මූලාශ්‍ර හා සම්පත් තිරසාර සංවර්ධනය උදෙසා සංරක්ෂණය කරමින් තිරසාරව භාවිතා කිරීම	14.2 සමුද්‍ර ජීවීන් සංරක්ෂණය	සමුද්‍ර සංරක්ෂණය උදෙසා ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් හා වැඩමුළු	-	√	-
		අලුත්වැඩියා කරනලද කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථාන.	-	√	-
15. භෞමික පරිසර පද්ධති ආරක්ෂා කිරීම, ප්‍රතිසංස්කරණ තිරසාර භාවිතය උදෙසා ප්‍රවර්ධනය වනාන්තර තිරසාර ලෙස කලමනාකරණය, කාන්තාරකරණයට එරෙහිව සටන් කිරීම, ජෛව විවිධත්වයට වන හානිය අවම කිරීම.	15.1 ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම, පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	වනජීවී රක්ෂිත ප්‍රදේශවල ඉදිකරන ලද නව ගොඩනැගිලි සංඛ්‍යාව	-	√	-
		මිලදී ගන්නා ලද යන්ත්‍ර හා කාර්යාල උපකරණ, වාහන සංඛ්‍යාව	-	√	-
		වනජීවී රක්ෂිත ප්‍රදේශ මැණුම් කිරීම හා වෙන් කිරීම.	-	√	-
		අලුත්වැඩියා කරන ලද ගොඩනැඟිලි, කාර්යාල උපකරණ, වාහන සංඛ්‍යාව	-	√	-
	15.1 වනජීවී සංරක්ෂණය උදෙසා මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	වනජීවී සංරක්ෂණය උදෙසා පුහුණු කරන ලද දේශීය වැඩ සටහන් සංඛ්‍යාව	-	-	√
		බාහිර පාර්ශවයන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	-	-	√
	15.1 රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය	ජාතික උද්‍යානවල වැඩිදියුණු කරන ලද මාර්ග පද්ධතිවල දුර ප්‍රමාණය(කි.මී.)	-	-	√
		සංවර්ධනය කරන ලද සනීපාරක්ෂක පහසුකම් සංඛ්‍යාව	-	-	√
		සංවර්ධනය කරන ලද ජල සැපයුම් පද්ධති හා සූර්යබල	-	-	√

		සැපයුම් පද්ධති සංඛ්‍යාව			
	15.1/15.9/15.c. වනඅලි මිනිස් ගැටුම අවම කිරීම	අළුතින් ඉදිකරන ලද විදුලි වැට දිග ප්‍රමාණය(කි.මී.)	-	√	-
		නඩත්තු කරන ලද විදුලි වැට දිග ප්‍රමාණය(කි.මී.)			
		නඩත්තු කරන ලද විදුලි වැට ආරක්ෂක කුටි සංඛ්‍යාව			
		මිලදී ගන්නාලද අලි වෙඩි ප්‍රමාණය			
		මිලදීගන්නා ලද විදුලි වැට උපකරණ සංඛ්‍යාව			
		වැඩිදියුණු කරන ලද වනජීවී වාසස්ථාන සංඛ්‍යාව.			
		පවත්වන ලද මහජනතාව දැනුවත් කිරීම් හා අධ්‍යාපන වැඩ සටහන් සංඛ්‍යාව.			
	15.7 වනසත්ව හා වාක්ෂලතා ආරක්ෂක ආඥා පනත හා වඳවීමේ තර්ජනයට ලක්වී ඇති වනසතුන් හා පැලෑටිවල ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය ක්‍රියාත්මක කිරීම	නිකුත් කරන ලද CITES හා FFPO බලපත්‍ර සංඛ්‍යාව	-	-	√
	15.7 වනජීවී සංරක්ෂණය උදෙසා නූතන ක්‍රමවේදයන් පිළිබඳ ජාත්‍යන්තර පුහුණුව	දේශීය හා විදේශීය පුහුණු වැඩ සටහන් සංඛ්‍යාව	-	-	√
	15.9 දේශීය ප්‍රජාවන්ගේ ජීවනෝපාය මාර්ග අවස්ථාවන් වැඩිකර ගැනීම	රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත ප්‍රජාවන්ගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය ප්‍රජා ව්‍යාපෘති සංඛ්‍යාව.	-	-	√

5.2 තිරසර සංවර්ධන අභිමතාර්ථ 14 හා 15 සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- **ජයග්‍රහණ**

i. රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත ප්‍රජාවන් එකී රක්ෂිත ප්‍රදේශ මත යැපීම අඩුකිරීම සහ එම ප්‍රජාවන්ගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ග්‍රාමීය ප්‍රජා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් වනසත්ත්ව මිනිස් ගැටුම් අවම කිරීමට හැකියාව ලැබීම.

ii. රට තුළ ආර්ථික අර්බුදයක් පැවති කාලසීමාවේදී පවා රක්ෂිත ප්‍රදේශ තුළ පරිසර පද්ධතීන් සංරක්ෂණය කරමින් සංචාරක කර්මාන්තය සඳහා ඇති ඉඩ ප්‍රස්ථා වැඩිකිරීම හා එමගින් දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමට හැකියාව ලැබීම.

iii. වනජීවීන්ගේ වාසස්ථාන සුපෝෂණ කටයුතු වැඩිකිරීම තුළින් වනඅලි මිනිස් ගැටුම අවම කිරීමට හැකියාව ලැබීම.

iv. අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩ සටහන් මඟින් මහජනතාව තුළ සංරක්ෂණය සඳහා දක්වන දායකත්වය ඉහළ නැංවීමට හැකිවීම.

v. CITES බලපත්‍ර නිකුත් කිරීමේ ඊ-සේවාව හා CITES, RAMSAR වැනි අන්තර්ජාතික සම්මුතින් ක්‍රියාත්මත කිරීම තුළින් ජාත්‍යන්තරය සමග කටයුතු කිරීම පහසුවීම.

අභියෝග

i. රටේ පැවති අයහපත් ආර්ථික අර්බුදය නිසා වෙන්කල ප්‍රතිපාදන සීමාසහිතවීම හා සංවර්ධන කටයුතු අතරමග නතර කිරීමට සිදුවීම.

ii. තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳව ප්‍රජාව දැනුවත් නොවීම.

iii. නව හඳුන්වාදීම් එකවර ග්‍රහනය කරගැනීමට පවත්නා උනන්දුව අඩුවීම.

iv. තිරසර සංවර්ධන අභිමතාර්ථ සපුරාගැනීමට යාමේදී අවශ්‍ය මානව සම්පත් හා භෞතික සම්පත්වල හිඟකම.

v. රජය හා පෞද්ගලික අංශ මගින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ස්වභාවික හා ජෛව සම්පත්වල ආරක්ෂාවට හා පැවැත්මට තර්ජන ඇතිවීම.

vi. විදුලි වැට ඉදිකිරීමේදී ඉඩම් සම්න්ධව ගැටළු ඇතිවීම හා මහජන විරෝධතා ඇතිවීම.

vii. ඉඩම් සම්බන්ධ ගැටළු විසඳීමේදී ඊට සම්බන්ධවන (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව /දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වැනි) ආයතන අතර පවතින අන්තර් සම්බන්ධතාවයේදී මුහුණදීමට සිදුවන ගැටළු

viii. කාලගුණික හා දේශගුණික විපර්යාසයන් ජයගැනීම තුළින් අපේක්ෂිත මට්ටමට ළඟාවීමට ඇති නොහැකියාව.

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

සේවා මට්ටම	අනුමත කාර්යය මණ්ඩලය	සේවයේ නියුතු කාර්යය මණ්ඩලය	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	85	49	37
තෘතියික	18	4	14
ද්විතීයික	1914	1131	782
ප්‍රාථමික	874	730	144
එකතුව	**2891**	**1914**	**977**

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයෙහි බලපෑම

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් නිසි පරිදි ඉටුකිරීම සඳහා දැනට මෙම දෙපාර්තමේන්තුව සතු කාර්ය මණ්ඩලය ප්‍රමාණාත්මක නොවීම හේතුවෙන් දිවයිනේ සෑම රාජකාරී ස්ථානයකටම නිලධාරීන් නිසි පරිදි අනුයුක්තකර ගත නොහැකි වීම මත දෙපාර්තමේන්තු අරමුණු ඵලදායීව ඉටුකර ගැනීම දුෂ්කර වී ඇත. ඉහතින් සඳහන් කරන ලද අරමුණු සඵලදායීව ඉටුකර ගැනීම සඳහා වර්තමාන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු ව්‍යුහය හා කාර්ය මණ්ඩල සංයුතියේ වෙනසක් සිදු නොකර සුදුසු ක්‍රමවේදයකින් පුරප්පාඩු පිරවීමට අවධානය යොමු කිරීම යෝග්‍ය වේ.

මේ අතර බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව මඟින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පුහුණුව සඳහා අනුයුක්ත කර තිබූ බහුකාර්ය සංවර්ධන සහායකයින් අලි වැට නඩත්තු සහායක තනතුර සඳහා තනතුරු 4731ක් දරන්නාට පෞද්ගලික වන සේ නැවත බඳවා නොගන්නා තනතුරක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට ස්ථිරවම බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා ක්‍රියාත්මක කරනු ලබන පුහුණු වැඩසටහන් වර්ග 2 කි.

1. කෙටිකාලීන විශේෂ පුහුණු වැඩසටහන්

2. දිගුකාලීන නිත්‍ය පුහුණු වැඩසටහන්

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ දැනුම හා කුසලතා පරාසය වැඩි කිරීමේ අරමුණ ඇතිව මෙම පුහුණු වැඩසටහන් පවත්වන අතර සෑම වැඩසටහනක් සඳහාම අදාල විෂය පථයන් සම්බන්ධව පුළුල් දැනුමැති සම්පත් දායකයන් සහභාගි කර ගනු ලැබේ.

පුහුණු වැඩසටහනේ නම	**පුහුණු සංඛ්‍යාව**	**වැඩසටහනේ කාලසීමාව**	**සමස්ත ආයෝජනය (රුපියල් මිලියන)**	**වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)**	**නිමැවුම (ලබාගත්දැනුම)**
1.කාර්යාල කළමනාකරණය, ලිපිගොනුකරණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුව	පුහුණු වැඩ සටහන් 7 ක් පවත්වා ඇත.	දින 03	3.6	දේශීය	කාර්යාලවල රාජකාරී කටයුතු ඉහළ මට්ටමකින් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍යය දැනුම ලබාදීම.
2.දෙමළ භාෂා ප්‍රවීණතාවය පිළිබඳ පුහුණුව	පුහුණු වැඩසටහන් 2 ක් පවත්වා ඇත.	දින12- දින 15	1.4	දේශීය	නිලධාරීන්ට දෙමළ භාෂා ප්‍රවීණතාව ලබා දී අදාල සහතිකය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දීම.
3.බංගලා භාරකරුවන් සහ සහකාර බංගලා භාරකරුවන්ගේ කුසලතා වර්ධන පුහුණුව	එක් පුහුණු වැඩසටහනක් පවත්වා ඇත.	දින 03	0.28	දේශීය	ඉහළ කාර්යක්ෂමතාවයකින් යුතු සුහදශීලී සේවයක් අදාල කාර්ය මණ්ඩලය වෙතින් ලබාගැනීම.
4. බඹර දෙබර හා වෙනත් කෘමීන්ගේ වද ආරක්ෂිතව ගලවා ඉවත් කිරීමේ පුහුණුව	එක් පුහුණු වැඩසටහනක් පවත්වා ඇත.	දින 03	0.29	දේශීය	ආරක්ෂිතව කඳු මුදුන් වැනි උස් ස්ථානවලට නැගීමේ හැකියාව වර්ධනය කිරීම සහ ආරක්ෂිතව කෘමීන්ගේ වද ගලවා ඉවත් කිරීමේ හැකියාව ප්‍රගුන කිරීම.

5.සන්නිවේදන පද්ධති භාවිතය පිළිබඳ පුහුණුව	එක් පුහුණු වැඩසටහනක් පවත්වා ඇත.	දින 03	0.35	දේශීය	සන්නිවේදන උපකරණ හා එම උපකරණ භාවිතය පිළිබඳ දැනුවත් භාවයක් ලබාදීම.
6. වනජීවී කෙෂ්ත්‍ර නිලධාරීන් සඳහා ප්‍රථමාධාර කටයුතු පිළිබඳ පුහුණුව	එක් පුහුණු වැඩසටහනක් ලබාදී ඇත.	දින 05	1.3	දේශීය	ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා හදිසි ප්‍රථමාධාර කටයුතු පිළිබඳ පුහුණුවක් ලබාදීම.
7.ස්වේච්ඡා මාර්ගෝපදේශක පුහුණුව	පුහුණු වැඩසටහන් 11 ක් පවත්වා ඇත	දින 03	2.5	දේශීය	සංචාරක මාර්ගෝපදේශකයෙකු ලෙස කටයුතු කරන ආකාරය පිලිබඳ නිසි පුහුණුව ලබාදීම.
8.පාරිසරික සංචාරක කටයුතු පිළිබඳ පුහුණුව	වැඩසටහනක් පවත්වා ඇත	දින 03	0.27	දේශීය	ප්‍රවේශපත් නිකුත් කිරීමේදී අනුගමනය කලයුතු ක්‍රියාපටිපාටිය සහ මුදල් ලේඛන පවත්වාගන යාම පිළිබඳ අවබෝධයක් ලබාදීම.
09.පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ පුහුණුව	පුහුණු වැඩ සටහනක් ලබාදී ඇත	දින 03	0.23	දේශීය	පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ නිසි අවබෝධයක් ලබාදීම.
10.ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා GIS භාවිතය පිළිබඳ පුහුණුව	පුහුණු වැඩ සටහනක් පවත්වා ඇත.	දින 03	0.29	දේශීය	නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වර්ධනයකිරීම.

11.නිලධාරීන් සඳහා ගබඩා කළමනාකරණය හා බඩු වට්ටෝරු ලේඛන නඩත්තුව පිළිබඳ පුහුණුව	පුහුණු වැඩ සටහන් 5 ක් පවත්වා ඇත.	දින 01	0.63	දේශීය	නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීම
12. කොටි මිනිස් ගැටුම මැඩපැවැත්වීම සඳහා ක්ෂේත්‍ර නිලධාරීන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ පුහුණුව	පුහුණු වැඩ සටහනක් පවත්වා ඇත.	දින 01	0.12	දේශීය	නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීම
13.ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ පුහුණුව	වැඩසටහනක් පවත්වා ඇත	දින 02	0.18	දේශීය	ප්‍රසම්පාදන කටයුතු කිරීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම
14. වන අලි - මිනිස් ගැටුම වැළැක්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ ක්ෂේත්‍ර නිලධාරීන්ට පුහුණුවක් ලබාදීම සහ රාජ්‍ය නිලධාරීන් හා ග්‍රාමීය ජනතාව දැනුවත් කිරීම	පුහුණු වැඩසටහන් 43 ක් කලාප 11 ක් ආවරණය වන පරිදි පවත්වා ඇත.	එක් දින වැඩසටහන්	1.56	දේශීය	වනජීවී සංරක්ෂණ කටයුතු පිළිබඳ නිලධාරීන් සහ ජනතාව දැනුවත්කිරීම.
15.කොටි මිනිස්ගැටුම් කළමනාකරණය	පුහුණු වැඩසටහන් 13 ක් පවත්වා ඇත	එක් දින වැඩසටහන්	0.57	දේශීය	වනජීවී සංරක්ෂණ කටයුතු පිළිබඳ නිලධාරීන් සහ

සඳහා ග්‍රාමීය ජනතාව සහ වතු කළමනාකාරීත්වය දැනුවත්කිරීම					ජනතාව දැනුවත්කිරීම.

එමෙන්ම නිලධාරීන් ගේ කුසලතා මගින් වනජීවී සංරක්ෂණ කටයුතුවලට අදාල සම්ත්දායකත්වය ලබාගැනීමේ අරමුණු ඇතිව කෙටි කාලීන පර්යේෂණ ව්‍යාපෘති සිදුකිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙනු ලැබේ. එම පර්යේෂණ වල ප්‍රතිඵල වනජීවී සංරක්ෂණ හා කළමනාකරණ කටයුතු සඳහා දායක කරගැනීම සිදු වේ. 2023 වසරේ මුදල් ප්‍රතිපාදන යටතේ දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් පර්යේෂණ 21 ක් සිදුකරන ලදී.

එයට අමතරව රක්ෂිත ප්‍රදේශ ජාලය තුළ හෝ ඉන් පිටත පර්යේෂණ සිදුකිරීම සඳහා බාහිර ආයතනවලින් පැමිණෙන පර්යේෂකයන් විසින් ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ යෝජනා දෙපාර්තමේන්තු පර්යේෂණ කමිටුව වෙත යොමුකර එහි නිර්දේශය මත අවශ්‍ය අනුමැතිය ලබාදීම ද සිදු කරනු ලැබේ. මේ යටතේ පර්යේෂණ කමිටු 04 ක් පවත්වා ඇති අතර එහිදි කමිටු සමාජිකයන්ගේ නිර්දේශය මත බාහිර පර්යේෂකයන්ගේ පර්යේෂණ ව්‍යාපෘති 120 ක් සිදුකිරීම සඳහා අනුමැතිය දී ඇත. වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා පාසැල් ළමුන් සහ රාජ්‍ය නිලධාරීන් ගේ සහයෝගය ලබාගැනීමේ අරමුණින් ලෝක තෙත් බිම් දිනය, ලෝක වනජීවී දිනය, ජෛව විවිධත්ව දිනය සහ ලෝක පරිසර දිනය සැමරීම සඳහා පාසල් සිසුන්ගේ සහභාගීත්වය ඇති විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන් 4 ක් පවත්වන ලදී.

ප්‍රචාරක වැඩසටහන්

වැඩසටහන	ප්‍රචාරක වැඩමුළු අත්පත්‍රිකා /සංඛ්‍යාව	සමස්ත ආයෝජනය (රුපියල්)	වැඩසටහනේ ස්වභාවය (දේශීය /විදේශීය)	නිමැවුම
වනජීවී සඟරාව මුද්‍රණය කිරීම	පිටපත් 1000	821033.50	දේශීය	වනජීවී සංරක්ෂණ කටයුතු පිළිබඳ නිලධාරීන් සහ ජනතාව දැනුවත් කිරීම
ලෝක වනජීවී දිනය සැමරීම	පොදු	745548.00	දේශීය	
වනන්තරේ කතන්දරේ ගුවන්විදුලි වැඩසටහන	පටිගත කිරීම 3	43,980.00	දේශීය	
මාධ්‍ය වැඩමුළුව අනුරාධපුර	පොදු	423,550.00	දේශීය	
වනජීවී ප්‍රවෘත්ති පත්‍රිකාව මුද්‍රණය කිරීම	ප්‍රකාශන 5	180,00000.	දේශීය	
කිඹුලන් පිළිබඳ අත්පත්‍රිකා මුද්‍රණය	පිටපත් 5000	55,000.00	දේශීය	
කඳුකර කොටි පිළිබඳ වාර්තා වැඩසටහන	විකාශය 2023.12.11 රාත්‍රී 9.30 ජාතික රූපවාහිනිය	95,686.60	දේශීය	
මාධ්‍ය වැඩමුළුව පොළොන්නරුව	පොදු මහජනතාව	185,970.00	දේශීය	
තෙත්බිම් දින වැඩසටහන	පොදු මහජනතාව	25,000.00	දේශීය	
Public Talk	වැඩ සටහන් 05	2500.00	දේශීය	

ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන ආකාරය

1. ආයතනයේ නිලධාරීන්ගේ පුහුණු වැඩසටහන්/ධාරිතා වර්ධන වැඩසටහන් හරහා දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමෙන් ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.
2. නව තාක්ෂණික ක්‍රමවේදයන් මානව සම්පත හරහා ආයතනයට අවශෝෂණය කරගැනීම තුළින් ආයතනික ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කරගැනීමට හැකිවීම හා වඩා ඵලදායී සේවාවක් ලබාදීමට හැකිවීම.
3. ආයතනයේ විධායක හා කළමනාකරණ මට්ටම හා පහළ ශ්‍රේණිවල නිලධාරීන් අතර මනා සන්නිවේදන ක්‍රමවේදයක් ඇතිකිරීම මඟින් ඔවුන් අතර සුහදතාවය වර්ධනය වන නිසා, ඇතිවන ගැටලුකාරී තත්ත්වයන් සාකච්ජා මාර්ගයෙන් විසඳා ගැනීමට හැකිවීමෙන් ආයතනයේ ඵලදායීතාව ඉහළ නැංවීම.
4. ආයතනික දැක්ම, මෙහෙවර සහ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය නිපුණතා වලින් හෙබි මානව සම්පත වර්ධනය කර ගත හැකිවීම.
5. වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා බාහිර පාර්ශ්වයන් සහභාගී කරගැනීමට දැනුවත් කිරීමේ වැඩ සටහන් උපකාරීවීම හා අලිමිනිස් ගැටුම කළමනාකරණය සඳහා ග්‍රාමීය ජනතාවගේ දායකත්වය ලබාගැනීමට හැකිවීම.

පරිච්ඡේදය 07

7.1 අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම		-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම		-	-
1.6	වෙනත්		-	-
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.		CIGAS මෘදුකාංගය මඟින් පවත්වාගෙන යනු ලැබේ.	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-

2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	ආයතනය තුල මූල්‍ය බලතල පවරාදී තිබීම.	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම.	අනුකූල වේ	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකුට හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව,රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ	-	-
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ	-	-

4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තු සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාරය මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ	-	-
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට,සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ	-	-
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2)DMA/1-2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම.	අනුකූල නොවේ	මසක් තුලදී පිළිතුරු සපයා නොමැති අවස්ථා ඇත.	ඉදිරිපත් කර ඇති විගණන වාර්තා ගණන 18 කි. මසක් ඇතුලත පිළිතුරු ලැබී ඇති විගණන වාර්තා ගණන 04 කි.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ	-	-
07	**විගණන කළමනාකරණ කමිටු**			

7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව , අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාල වර්ෂයතුල පවත්වාගෙන තිබීම.	අනුකූල වේ	-	-
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව , වත්කම් මිලදී ගැනීම හා අපහරණයකිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල නොවේ	කළාප කාර්යාල 15 න් 05 ක් නියමිත දිනට අවසන් කර ඇත.	දිවයින පුරා විහිදී පවතින උපකාර්යාල විශාල සංඛ්‍යාවක් පැවතීම හේතුවෙන් නියමිත දිනට අවසන් කළ නොහැකි වීම.
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම.		කළාප කාර්යාල තුනක කටයුතු අවසන් කර ඇත.	ඉතිරි කාර්යාලයන්හි අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී.
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම.	අනුකූල වේ	-	-
09	**වාහන කළමනාකරණය**			

9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	එවැනි ගිණුමක් නොමැත.	-	-
9.2	වාහන ගර්හිතවී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණයකර තිබීම.	අනුකූල නොවේ	ප්‍රායෝගිකව මාස 06කට වඩා ගතවීම.	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙනයාම.	අනුකූල වේ	-	-
9.4	සැම වාහන අනතුරක් සම්බන්ධයෙන් මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල නොවේ	104(අ) මු.රෙ.පරීක්ෂණ අවසන් කිරීමට නියෝග ලබාදී ඇත.	2022 වර්ෂයට අදාල මු.රෙ. පරීක්ෂණ වාර්තා එම වර්ෂයේදීම අවසන් කිරීමට කමිටුවක් පත්කිරීමට කටයුතු කරනු ලැබේ.
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනයවීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම.	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙලකර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	එවැනි ගිණුමක් නොමැත.	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණයවූ හා ගැලපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම.		ගනුදෙනු බහුලතාවය නිසා මසක් තුළ සිදුකර නොමැති අතර, ඉදිරියේ දී එසේ	

			කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.	
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ	-	-
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ	-	-
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ	-	-
12.2	හිඟහිටි ණයශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණයශේෂ නිරවුල් කර තිබීම.		අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී.	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ	-	
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීනකර පවත්වාගෙනයාම.	අනුකූල වේ	-	
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ	-	-
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන්වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-

14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත්කර තිබීම.	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය , භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම.	අනුකූල වේ	-	-
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර තිබීම.	අනුකූල වේ	-	-
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාවතුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙනයාම.	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ	-	-
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛණයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ	-	-

17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම.	අනුකූල නොවේ.	වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල නොවේ	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඍජුවම සංචාරක බංගලා වෙන්කිරීම සම්බන්ධව පමණක් වුවද මෙයද මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ කරගතහැකි බැවින් පුරවැසි ප්‍රඥප්තියක් සැකසීමේ අවශ්‍යතාවයක් පැන නොනැගේ.	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ	-	-
19	**මානව සම්පත් සැළැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැළැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ	-	-
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැළැස්ම තුල තහවුරු කොට තිබීම.	අනුකූල වේ.	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම්කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ.	-	-

19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැළැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩ සටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම.	අනුකූල වේ	-	-
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ	-	-